

ආයතනය - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

අමාත්‍යාංශය - නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා

ලිපිනය - "නිපුණතා පියස"
නො. 354/2
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

ඊ මේල් ලිපිනය - info@vtasl.gov.lk

වෙබ් අඩවිය - www.vtasl.gov.lk

විගණකවරු - විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන් - මහජන බැංකුව

පටුන

දැක්ම හා මෙහෙවර	1
කාර්යයන්	2
පිළිගැන්වීම	3
හැඳින්වීම හා ව්‍යුහය	5
අධ්‍යක්ෂ මණ්ඩලය	5
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	7
2019 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක	9
ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය	10
කාර්යය මණ්ඩල සංයුතිය	13
වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම	17
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය	21
වෘත්තීය පුහුණු පරීක්ෂණ පැවැත්වීම හා ඇගයීම්	23
වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය	23
රැකියාගත කිරීම	24
රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්	27
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	27
අභියෝග	28
විගණන හා කළමණාකරණ කමිටු කාර්ය සාධනය	29
මුල්‍ය ප්‍රකාශන වාර්තාව	32
විගණකාධිපති වාර්තාව	62
විගණකාධිපති වාර්තාව සඳහා නිරීක්ෂණ වාර්තාව	72

දැක්ම

ගෝලීය රැකියා වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලංකාවේ
ක්‍රියාශීලී හා නිර්මාණශීලී වෘත්තීය පුහුණුව සපයන ප්‍රමුඛතම
ආයතනය වීම.

මෙහෙවර

වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවීන ක්‍රමවේදයන් හා
තාක්ෂණයන් මගින් පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින්
ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස පහසුකම් සැලසීම.

අපගේ සේවාවන් හා පහසුකම් ඉහලම ප්‍රමිතියක තබා ගනිමින් හා
ජාත්‍යන්තර රැකියා ප්‍රවණතාවයන් ඉලක්ක කර ගනිමින් අපි මෙම
මෙහෙවර සාක්ෂාත් කර ගන්නෙමු.

කාර්යයන්

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා බාහිර ආයතන ද සම්බන්ධ කර ගනිමින් තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව හා නිපුණතාවය ලබා දීම.

- නිපුණතා පාදක අවසන් ඇගයීම් පැවැත්වීම, ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම, වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම හා වාර්තා නිකුත් කිරීම.

- ජාතික වෘත්තීය පරීක්ෂණ හා අවසන් පරීක්ෂණ පැවැත්වීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් මෙහෙය වීම.

- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබා දීම.

- වෘත්තීය පුහුණුව ලැබූ තරුණ පිරිසට වැඩිදුර පුහුණුව ලබා දීම, රැකියාගත කිරීම සහ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

පිළිගැන්වීම

විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මැතිතුමිය,
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය,
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය,
"නිපුණතා පියස"
නො. 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

ගරු අමාත්‍යතුමියනි,

වාර්ෂික වාර්තාව - 2018
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)C වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට,
විශ්වාසී,



එරංග බස්නායක
සභාපති/ විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත් කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ඇතුළු සාමාජිකයන් 10 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විත වේ. 2018 වර්ෂය තුල පාලක මණ්ඩල 03 ක් පහත පරිදි ක්‍රියාත්මක විය.

අධ්‍යක්ෂ මණ්ඩලය
(2018.01.30 සිට 2018.06.10)

- **ආචාර්ය (ඉංජිනේරු) ලයනල් පින්ටු මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **ශෙහාන් සෙනෙවිරත්න මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය
- **නීතිඥ තිලක් කාරියවසම් මහතා**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **නීතිඥ සමන් සේනාධීර මහතා**
- **ඩී. එච්. එස්. පුල්ලේපෙරුම මහත්මිය**
  අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යාංශය
- **ආචාර්ය (ඉංජිනේරු) ලලිත් ලියනගේ මහතා**
- **ආර්. පී. ඒ. විමලවීර මහතා**
  කම්කරු කොමසාරිස්
  කම්කරු දෙපාර්තමේන්තුව
- **සුරේශ් ද මෙල් මහතා**
- **ඒ. එස්. හේවගේ මහතා**
  අතිරේක ලේකම් (පාසල් කටයුතු)
  අධ්‍යාපන අමාත්‍යාංශය
- **නීතිඥ ලක්ෂමන් සරත් වීරක්කොඩි මහතා**
- **ඒ. එච්. එම්. යූ. අරුණ බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ (සැලසුම්)
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය
2018.06.14 සිට 2018.10.26

- **නීතිඥ රවි ජයවර්ධන මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **තිසර ධනුෂ්ක ගුණසිංහ මහතා**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **ඩී.එච්.එස්.පුල්ලේපෙරුම මහත්මිය**
  අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යාංශය
- **ඒ.එස් හේවගේ මහතා**
  අතිරේක ලේකම් : පාසල් කටයුතු
  අධ්‍යාපන අමාත්‍යාංශය
- **ආර්.පී.ඒ. විමලවීර මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තමේන්තුව
- **ඒ.ඒච්.එම්.යු..අරුණ බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ:සැලසුම්
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- **සාරංග අලහප්පෙරුම මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරිමේ අධිකාරිය
- **නිතීඥ සමන් සේනාධීර මහතා**
- **සුරේෂ් ද මෙල් මහතා**
- **වසන්ත පෙරේරා මහත්මිය**
- **මාගධි ප්‍රතාපසිංහ මහත්මිය**

අධ්‍යක්ෂ මණ්ඩලය
2018.11.14 සිට 2018.12.31

- **ප්‍රසන්න ප්‍රනාන්දු මහතා**
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **තිසර ධනුෂ්ක ගුණසිංහ මහතා**
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- **ඩී. එච්. එස්.පුල්ලේපෙරුම මහත්මිය**
  අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යාංශය
- **ඒ. එස්. හේවාගේ මහතා**
  අතිරේක ලේකම් (පාසල් කටයුතු)
  අධ්‍යාපන අමාත්‍යාංශය
- **ආර්.පී.ඒ. විමලවීර මහතා**
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තමේන්තුව
- **ඒ.එච්.එම්.යූ. අරුණ බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- **සාරංග අලහප්පෙරුම මහතා**
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරිමේ අධිකාරිය
- **ප්‍රතාප් ප්‍රනාන්දු මහතා**

2018 වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවනු ලැබිය.

2018 වර්ෂයේ දී ජාතික වෘත්තීය පුහුණු ආයතන 07 ක් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශියව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 191 හා ලියාපදිංචි වූ බන්ධනාගාර හා පුනරුත්තාපන මධ්‍යස්ථාන 06 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 226 ජාලයක් ක්‍රියාත්මක කරමින් වෘත්තීය පුහුණු වැඩසටහන් 2273 ක් පූර්ණ කාලීනව හා අර්ධ කාලීනව පවත්වා යෞවන යෞවනියන් 36667 කට තම සේවය සැපයීමට සමත් වූ මෙම ආයතනය මෙම වසරේ දී සිය 22 වන සංවත්සරය සමරනු ලැබීය.

2018 වසරේ ජයග්‍රහණයන්

- දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 226 ක දී පාසල් අධ්‍යාපනය නිම කළ තරුණ තරුණියන් 32474 කට පූර්ණ කාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම.
- වෘත්තිය ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන්ගේ වෘත්තීය සංවර්ධනයට හා අභිමත වෘත්තීන්ට පිවිසීමට බලාපොරොත්තු වන ආධුනිකයන් 4193 දෙනෙකු සඳහා අර්ධ කාලීන පුහුණුව ලබාදීමග
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 19354 ක් (NVQ) නොවන සහතික 2477 ක් පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 1441 ක් වශයෙන් සහතික 23272 ක් නිකුත් කිරීම.
- පුහුණුව සාර්ථකව අවසන් කල ආධුනිකයන් දේශීය රැකියා අවස්ථා 6542 ක් විදේශීය රැකියා අවස්ථා 107 ක් හා ස්වයං රැකියා 1374 ක් වශයෙන් 8023 දෙනෙකු රැකියා සඳහා යොමු කිරීම.
- පුහුණු මධ්‍යස්ථාන 102 ක් සඳහා තත්ත්ව කළමනාකරණ සහතිකය ලබා ගැනීම.
- සියළුම පාඨමාලා සඳහා පොදු කාලසටහනක් පිළියෙල කර ඒ අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කඩිනම් (දින 120) පුහුණු වැඩ සටහනේ පලමු අදියර යටතේ ඉදිකිරීම් ශිල්පිණි දැව තාක්ෂණ ශිල්පි හා ජලනල කාර්මික ශිල්පීන් 95 දෙනෙකු පුහුණු කිරීම හා එහි 2 වන අදියර තලල්ල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආරම්භ කර 46 දෙනෙකු පුහුණු කිරීම.
- නෙදර්ලන්තයේ ආධාර යටතේ ඉදිවන පොළොන්නරුව ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.
- 2019 වර්ෂයේ පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඔරුගොඩවත්ත පුහුණු මධ්‍යස්ථානය සඳහා අනුයුක්ත කර ඇති අධ්‍යාන කාර්ය මණ්ඩලය 18 දෙනෙක් සඳහා දකුණු කොරියාවේ විෂයානුබද්ධ පුහුණුවක් ලබා දීම.
- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 36 ක් පවත්වා 719 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීම හා ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පුහුණුලාභීන් 139 ක් සඳහා රුපියල් මිලියන 61.39 ක් රාජ්‍ය බැංකු හරහා ණය පහසුකම් ලබාදීම.
- පුහුණුව ලබන ආධුනිකයන් 1256 ක් දැනුම කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා 46 ක් සඳහා යොමු කිරීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සම්බන්ධතා ගොඩනැගීමේ වැඩසටහන යටතේ (PPP) කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 32 ක් පවත්වා වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන් 2640 දෙනෙකුගේ නවීන තාක්ෂණික දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම.

- ආයතනයේ සතු මානව සම්පත්, දැනුම, ආකල්ප හා කුසලතාවයන්ගෙන් පෝෂණය කිරීමේ අරමුණින් අධ්‍යන කාර්යය මණ්ඩලයේ 724 දෙනෙකු හා අනධ්‍යන කාර්යය මණ්ඩලයේ 51 දෙනෙකු සඳහා පුහුණුව ලබාදීම.
- දිවයින පුරා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 3356 ක් පැවැත්වීම මගින් පාසල් දරු දැරියන්, පාසල් හැර ගිය දරුවන් දෙමපියන්, ගුරුවරුන් ඇතුලු 171765 දෙනෙකු වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීම.
- සියළුම පාඨමාලා අධීක්ෂණ තොරතුරු අන්තර්ජාල මෘදුකාංගයක් භාවිතයෙන් විශ්ලේෂණය කිරීම මගින් පාඨමාලාවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය නිලධාරින් සඳහා පරිගණක භාවිතය හා කළමනාකරණය පිළිබඳ අර්ධ කාලීන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- යුනිලීවර් ආයතනයේ ප්‍රිමියම් එක්ස්පෝට් සමාගමේ අනුග්‍රහයෙන් ආගරපතන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.
- හෙල්පේජ් ශ්‍රී ලංකා ආයතනය හා එක්ව වැඩිහිටි සත්කාරක සේවා සහායක පාඨමාලාව ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තයේ නියැලී සිටින්නන් හට ඔවුන්ගේ නිපුණතාවයන් වර්ධනය කර ගැනීම හා ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමේ අරමුණින් එම එක් එක් වෘත්තීන් සඳහා අදාල ජාතික වෘත්තීය සුදුසකම් ජාතික වශයෙන් පිරිනැමීම සඳහා වූ කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් ආරම්භ කිරීම.
- මහවැලි අධිකාරිය හා ඒකාබද්ධව ඇති කරගනු ලබන අවබෝධතා ගිවිසුමකට අනුව මහවැලි කලාප 10ක් තුළ ජීවත්වන අඩු ආදායම්ලාභී දූ දරුවන් හට වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තුළ වෘත්තීය පුහුණුව ලබා දීමටත් ඔවුන් හට මහවැලි අධකාරිය මගින් පුහුණු කාලය තුළ ශිෂ්‍යත්වයක් පිරිනැමීමටත් වැඩපිළිවෙලක් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයේ විදුලි කාර්මිකයන් විදුලි කාර්මික ශිල්පි මට්ටම් 4 (NVQ L4) සඳහා පුහුණු කර වීම.

2019 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

- දිවයින පුරා තරුණ තරුණියන් 39860 කට පූර්ණ කාලීන වෘත්තීය පුහුණුව ලබාදීම.
- රැකියාවන්හි නිරතවූවන් සහ රැකියා අපේක්ෂිතයන් 13338 කට අර්ධ කාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 18000 ක් සහ (NVQ) නොවන සහතික 1000 ක් වශයෙන් සහතික 19000 ක් නිකුත් කිරීම.
- කොරියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ඉදිකර ඇති ඔරුගොඩවත්ත පුහුණු මධ්‍යස්ථානයේ

  NVQ Level 5 මට්ටමේ නව පාඨමාලා නවයක් ආරම්භ කිරීම.

  - CNC තාක්ෂණය (CNC Technology)
  - රොබටික් තාක්ෂණය (Robotic Technology)
  - වාතරෝදක හා ද්‍රව තාක්ෂණය (Pneumatics) hydraulic Technology)
  - මෝටර් රථ තාක්ෂණය (Automobile Technology)
  - පැස්සුම් තාක්ෂණය (Welding Technology)
  - විදුලි තාක්ෂණය (Electrical Technology)
  - ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය (Electronic Technology)
  - මෙකාට්‍රොනික් තාක්ෂණය (Mechatronic Technology)
  - ශීතකරණ හා වායු සමීකරණ තාක්ෂණය (Refrigeration & Air conditioning Technology)
- වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳව දිවයින පුරා පාසල් සිසුන්, පාසල් හැරගිය තරුණ තරුණියන්, වෘත්තීය පුහුණුලාභීන්ගේ දෙමව්පියන් ගුරුවරුන් හා වෙනත් සමාජ සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 4,176 මගින් 164,100 දෙනෙකු දැනුවත් කිරීම.
- සාර්ථකව පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිගැන්වීමක් ලෙස ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 25 ක් පවත්වා SEPI ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්නා ව්‍යාපාර සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සලසා දීම.
- පුහුණුව අවසන් කරන ආධුනිකයන් 7,800 ක් දේශීය රැකියා සඳහාත් 500 ක් විදේශීය රැකියා සඳහාත් 1,000 ක් ස්වයං රැකියා සඳහාත් ලෙස 9,100 ක් රැකියා සඳහා යොමු කිරීම.
- පුහුණුව අවසන් කරන ආධුනිකයන් රැකියාගත කිරීම හා වැඩිදුර පුහුණු අවස්ථා ලබාදීම අරමුණු කරගෙන රැකියා වෙළඳපොළ 10 ක් පැවැත්වීම.
- පුහුණුව ලබන ආධුනිකයන්ගේ දැනුම කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා 75 ක් සංවිධානය කිරීම.
- වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන්ට ක්ෂේත්‍රය තුළ දැනුම හා තාක්ෂණික කුසලතා යාවත්කාලීන කිරීමේ අරමුණු ඇතිව කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 40 ක් නිපුණ ශිල්පීන් 2,070 සඳහා පැවැත්වීම.
- වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුල නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් කර්මාන්ත හිමියන් දැනුවත් කිරීමේ වැඩ මුළු 04 ක් පැවැත්වීම.
- වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන්ට ක්ෂේත්‍රය තුළ දැනුම හා තාක්ෂණික කුසලතා යාවත්කාලීන කිරීමේ අරමුණු ඇතිව කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 40 ක් නිපුණ ශිල්පීන් 2,070 සඳහා පැවැත්වීම.
- අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන "13 වසර දක්වා අනිවාර්ය අධ්‍යාපනය" වැඩසටහනේ නියමු ව්‍යාපෘතියක් වන දිවයින පුරා තොරාගත් පාසල් 42 ක තාක්ෂණ වේදය විෂයධාරාව හදාරන සිසුන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම.



අචාර්ය (ඉංජිනේරු) ලයනල් පින්ටු
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය

සභාපති

1. ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්ටු මහතා (2017.06.07- 2018.05.31)
2. නීතීඥ රවී ජයවර්ධන මහතා (2018.06.14 - 2018.10.29)
3. ප්‍රසන්න ප්‍රනාන්දු මහතා (2018.11.26 දින සිට)

උප සභාපති

1. නීතීඥ තිලක් කාරියවසම් මහතා (2017.06.07 -2018.05.31)
2. කේ. තිසර ධනුෂ්ක ගුණසිංහ මහතා (2018.07.26 දින සිට)

අධ්‍යක්ෂ ජනරාල්

එච්. චූලාංගනී පෙරේරා මිය

අධ්‍යක්ෂවරු

1. ඩබ්. ඒ. රණවීර මහතා
2. ආචාර්ය සිද්ධිකා ජී. සේනාරත්න මිය (2018.07.31 දින සේවයෙන් ඉවත් වී ඇත.)
3. සමන් කුලසූරිය මහතා
4. එච්. යූ. කාරියවසම් මහතා (වැ.බ)
5. යූ. කේ. නන්ද මහතා (2018.09.03 දින සිට)
6. එස්. එම්. එදිරිසිංහ මිය :2018.09.03 දින සිට)
7. ජී. එච්. පී. දමයන්ති මිය (2018.08.01 දින සිට වැ.බ)

ප්‍රධාන අභ්‍යන්තර විගණක

1. පී. එම්. විජේසිංහ මහතා (රාජකාරී ඉටු කිරීම) - (2018.04.29 දින විශ්‍රාම ගොස් ඇත)
2. ආර්. පී. හෙට්ටිආරච්චි මහතා (රාජකාරී ඉටු කිරීම) - (2018.08.20 දින සිට)

නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

1. එන්.ඩී.පී. ධම්මික මහතා
2. එන්.එස්.ඩී. නවරත්න මහතා
3. ඒ.කේ. ආරච්චිගේ මහතා
4. ඊ.ඒ.ඩී.එස් සේනාරත්න මහතා
5. ජී.වී.පී.එන්. පෙරේරා මහතා
6. ආර්.එන්.කේ.එම්.ජේ.සෙනෙවිරත්න මහතා
7. එන්.කේ. ඉලේසිංහ මහතා
8. එච්.ටී.එස්. වික්‍රමරත්න මහතා (2018.08.01 දින සේවයෙන් ඉවත් වී ඇත.)
9. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා
10. එම්.එම්.එන්.බී. මධුරසිංහ මහතා
11. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා
12. ඩබ්.ජී. විජේරත්න මහතා
13. එච්.පී. මනම්පේරි මහතා
14. ඒ.එම්.ටී.එස්. ආටිගල මහතා
15. ටී. විනෝදරාජා මහතා
16. ජී.ඩී. ජයසිංහ මහතා (2018.10.10 දින විශ්‍රාම ගොස් ඇත.)
17. වී. කනගසුන්දරම් මහතා
18. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
19. වී.ජී. නිමල්සිරි මහතා (2018.03.01 දින සිට)
20. පී.එන්. අබේසිංහ මහතා (2018.03.01 දින සිට)
21. ඩී.ඒ.එස්. අතුකෝරල මහතා (2018.03.01 දින සිට)
22. ආර්.එම්.ආර්.රත්නායක මහතා (2018.03.01 දින සිට)
23. බී.එච්.ඒ. නෙල්සන් මහතා
24. එස්. මැද්දේගොඩ මහතා
25. එම්.ජී.ජී. සමන් මහතා (2018.03.01 දින සිට)
26. කේ.ඩී.එන්. ද සිල්වා මහතා (2018.12.04 දින සිට)
27. ඩී.ඒ. ජයරත්න මහතා (2018.03.01 දින සිට)
28. ආර්. සුනිල් මහතා (2018.03.01 දින සිට)
29. එන්.එම්.වී.කේ. හේරත් මිය (2018.03.01 දින සිට)
30. පී.ජේ. ජයවර්ධන මිය (2018.03.31 දින සිට)
31. එම්.කේ.බී.ජයතිලක මහතා (2018.03.31 දින සිට)
32. එම්.බී.නලීම් මහතා (2018.05.30 දින සිට)
33. ආර්. පතිරගේ මිය. (2018.08.15 දින සිට)

සහකාර අධ්‍යක්ෂවරු

1. ඒ.ඒ. ජබීර් මහතා
2. පී.බී.ජී.අයි.බී. වැගන්තලේ මහතා
3. රාධක්‍රිෂ්ණන් මධුරතන් මහතා
4. කේ. නිරංජන් මහතා
5. ඒ.ඒ.ඩබ්.ජී.ආර්.ආර්. බණ්ඩාර මහතා
6. ජී.එල්.ඒ. පීරිස් මහතා
7. සී.ජේ. විද්‍යානපතිරණ මහතා
8. පී.ජී. ප්‍රසන්න මහතා
9. එච්. එදිරිසිංහ මිය
10. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
11. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
12. යූ.ජී.ජේ.ප්‍රියදර්ශන මහතා
13. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
14. ජේ.ඉනෝකා යූ.පී.ගුණවර්ධන මෙනෙවිය
15. ඊ.ජේ. විජේතුංග මහතා
16. ඩබ්. එම්. ඒ. එස්. එල්. විජේනායක මිය
17. එච්. එල්. සිසිර මහතා
18. ඩබ්. කේ. සුමිත් වසන්ත මහතා
19. ආර්. අහිලන් මහතා
20. එච්. ටී. ඩී. ආර්. එස්. විජේසිංහ මහතා
21. තිළිණ රණසිංහ මහතා
22. ජී.ඩී. ශ්‍යාමලී මිය
23. සී.ඩී. සමරනායක මහතා
24. සී.යූ.එම්. කොඩිතුවක්කු මිය
25. සුනිල් අබේසිංහ මහතා
26. ජී.කේ.ඩී.සී. කුමාර මහතා
27. එස්.එම්.ජේ. සුවේන්ද්‍ර මහතා
28. එස්.එම්.එම්.කේ. සියමුදලි මිය
29. එන්.කේ. අඹගහවත්ත මිය
30. ඩී.සී.ඕ. විතාන මිය
31. ඒ.ඩී.එස්. සමරසිංහ මහතා
32. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
33. එල්.පී.කේ.ඩබ්ලිව්. වැලිවත්ත මහතා
34. ඩී.එම්.පී.එස්. අතුකෝරළ මහතා
35. ඩී.එම්. යහම්පත් මහතා
36. කේ. පී. ඩී. පී. සිරිසේන මහතා
37. එන්. ඒ. ඒ. ඩී. නාගහවත්ත මහතා
38. එම්. පී. හර්ෂණ කුසුම්සිරි මහතා (2018.03.13 දින සිට)
39. නීති නිලධාරි/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් -
    ඩබ්. ජී. ඊ. එම් ජිනදාස මෙනවිය
    (2018.12.16 දින සේවයෙන් ඉවත් වී ඇත.)

කාර්යය මණ්ඩල සංයුතිය

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2018.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 1984 දෙනෙකු සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2018 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2717 කි.

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය	සේවා කාණ්ඩය
01.	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0	HM 2 - 1
02.	අධ්‍යක්ෂ	6	5	1	HM 1 - 1
03.	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	0	1	
04.	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	86	70	16	MM 1 - 1
05.	නීති නිළධාරී	1	0	1	
06.	අභ්‍යන්තර විගණක	1	1	0	
07.	ඉංජිනේරු	1	0	1	
08.	පරිපාලන නිළධාරී	2	2	0	JM 1 -1
09.	පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී	12	11	1	
10.	විමර්ශන නිළධාරී	1	1	0	
11.	ප්‍රවාහන නිළධාරී	1	0	1	
12.	සැපයුම් නිළධාරී	1	1	0	
13.	මුද්‍රණ නිළධාරී	1	0	1	
14.	අභ්‍යන්තර විගණන නිළධාරී	3	2	1	
15.	පද්ධති විශ්ලේෂක	1	0	1	
16.	සුභසාධක නිළධාරී	1	1	0	
17.	ගිණුම් නිළධාරී	33	30	3	
18.	ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී	10	10	0	
19.	පුහුණු නිළධාරී	98	65	33	
20.	පර්යේෂණ නිළධාරී	2	2	0	
21.	සැළසුම් නිළධාරී	2	2	0	
22.	සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර	1	0	1	
23.	පෞද්ගලික සහකාර *	7	5	0	

24.	භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)	1	0	1	MA 5 - 2
25.	භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)	3	0	3	
26.	ජ්‍යෙෂ්ඨ උපදේශක	201	14	187	MA 4
27.	වැඩසටහන් නිළධාරී	69	66	3	
28.	විගණන සහකාර *	3	1	0	
29.	ව්‍යාපෘති සහකාර *	34	9	0	MA 3
30.	තාක්ෂණික සහකාර	3	1	2	MA 2 - 2
31.	උපදේශක	1,614	1,246	368	
32.	ක්‍රීඩාඋපදේශක	31	0	31	
33.	සැලසුම් ශිල්පී	1	0	1	
34.	ප්‍රමාණ සමීක්ෂක	2	0	2	
35.	කාර්මික නිලධාරී (සිවිල්)	5	0	5	
36.	කළමණාකරණ සහකාර	191	184	7	MA 1 - 2
37.	සහකාර උපදේශක (LRUC)*	38	32	0	
38.	ඇමුණුම්කරු (මුද්‍රණ)	3	1	2	
39.	නිවාඩු නිකේතන භාරකරු	2	0	2	
40.	සුපරීක්ෂක (මුද්‍රණ)	1	0	1	
41.	සුපරීක්ෂක (ගොඩනැගිලි)	1	0	1	
42.	රියදුරු	64	64	0	PL - 3
43.	ගබඩාකරු *	2	2	0	PL - 2
44.	මුද්‍රණ සහයක	3	2	1	
45.	බැඳුම්කරු (මුද්‍රණ)	2	1	1	
46.	යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ)	2	2	0	
47.	කාර්යාල සහයක	8	5	3	PL - 1
48.	මුරකරු *	65	44	0	
49.	කම්කරු	95	101	0	
	එකතුව	***2,717***	***1,984***	***683***	

කාර්යය මණ්ඩල සංයුතිය (සේවා කාණ්ඩය අනුව)

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු /අතිරික්තය
01.	HM 2 - ජ්‍යෙෂ්ඨ කළමනාකාර HM 1 - 1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර	08	06	02
02.	MM 1 - 1 කළමනාකාර	89	71	18
03.	JM 1 - 1 කණිෂ්ඨ කළමනාකාර	176	132	42
04.	MA 5 - 2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ /ව්‍යාප්ති නිලධාරීන්	04	0	04
05.	MA 4 ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා	273	81	190 (*1 Personal)
06.	MA 3 ආශ්‍රිත නිලධාරීන්	34	09	0 (*9 Personal)
07.	MA 2-2 කළමනාකාර සහකාර - තාක්ෂණ	1656	1247	409
08.	MA 1-2 කළමනාකාර සහකාර - තාක්ෂණ නොවන *	236	217	13(* 33 personal)
09.	PL 3 ප්‍රාථමික ශිල්පී	64	64	
10.	PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී	09	07	02(* 02 Personal)
11.	PL 1 ප්‍රාථමික ශිල්පී නොවන	168	150	03(*03 Personal)
	එකතුව	***2,717***	***1,984***	***683***

* දැනට සිටින පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුර අනුමත කර ඇත. ඉන්පසු අහෝසි වේ.

සේවා ගණය



කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම

2018 වර්ෂයේ දී පහත වර්ගීකරණයක් යටතේ කාර්යය මණ්ඩලය අදාල වැඩසටහන් සඳහා සහභාගී කරවීමට හැකිවිය.

	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවූ සංඛ්‍යාව
අධ්‍යයන	53	724
අනධ්‍යයන	16	51
විදේශීය	-	29

වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

2018 වර්ෂයේ පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා 134 කට ඇතුලත් වන පුහුණු වැඩසටහන් 2,273 ක් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 36,667 කි. ඊට අමතරව කුසලතා සංවර්ධන වැඩසටහන් හා ව්‍යවසායකත්ව සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් පුහුණුව ලද සංඛ්‍යාව 3,359 කි. ඒ අනුව 2018 වර්ෂයේ පුහුණුව ලැබූ සමස්ථ ආධුනිකයන් සංඛ්‍යාව 40,026 කි.

වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම

වර්ෂය	2016	2017	2018
පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව	35,013	36,695	36,667
පුහුණුව අවසන් කල සංඛ්‍යාව	29,364	30,056	29,616

* 2018 වර්ෂයේ පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින් සංඛ්‍යාව 2,997 දෙනෙකු 2019 වසරේදී පුහුණුව අවසන් කිරීමට නියමිතය.

වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම /පුහුණුව අවසන් කිරීම



පුහුණු ක්ෂේත්‍ර සඳහා ආධුනික ඉල්ලුම - 2018

	ක්ෂේත්‍රය	ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව ආයතනික (පුහුණුව)			ප්‍රතිශතය
		ගැහැණු	පිරිමි	මුළු ගණන	
1.	කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත්	15	31	46	0.13%
2.	මෝටර් රථ අලුත් වැඩියා හා නඩත්තුව	3165	80	3245	8.85%
3.	ගොඩනැගිලි හා ඉදිකිරීම්	3015	596	3611	9.85%
4.	විදුලි හා විද්‍යුත් සහ විදුලි සංදේශ	3842	106	3948	10.77%
5.	ධීවර හා මත්ස්‍ය වගාව	36	2	38	0.10%
6.	ආහාර තාක්ෂණය	568	245	813	2.22%
7.	මැණික් හා ස්වර්ණාභරණ	116	42	158	0.43%
8.	හෝටල් හා සංචාරක	1961	265	2226	6.07%
9.	තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	3523	5619	9142	24.93%
10.	සම් ආශ්‍රිත නිෂ්පාදන	29	29	58	0.16%
11.	ලෝහ හා ලුහු ඉංජිනේරු	1369	7	1376	3.75%
12.	කාර්යාල කළමණාකරණය	10	130	140	0.38%
13.	දැව ආශ්‍රිත	1040	72	1112	3.03%
14.	පුද්ගල හා සමාජ	733	5121	5854	15.97%
15.	මුද්‍රණ හා ඇසුරුම්	56	36	92	0.25%
16.	ශීතකරණ හා වායුසමීකරණ	627	13	640	1.75%
17.	රෙදිපිළි හා ඇඟළුම්	799	3338	4137	11.28%
18.	සෞඛ්‍ය හා සමාජ කටයුතු	0	0	0	0
19.	වෙනත්	31	0	31	0.08%
	එකතුව	20935	15732	36667	100.00%

පුහුණුවට බඳවා ගැනීම -2018



රැකියා අවස්ථා බහුල ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ථ ඇතුලත් වීමෙන් 40% කි.

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
මෝටර් රථ අලූත්වැඩියා හා නඩත්තුව	3165	80	3245	8.85
ගොඩනැගිලි හා ඉදිකිරීම්	3006	592	3598	9.81
විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ	3842	106	3948	10.77
හෝටල් හා සංචාරක	1961	265	2226	6.07
දැව ආශ්‍රිත	1040	72	1112	3.03
ශීතකරණ හා වායුසමීකරණ	627	13	640	1.75
එකතුව	13641	1128	14769	40.28



පුහුණුවට බඳවා ගැනීම-2018



	Level 1	Level 2	Level 3	Level 4	Level 5	Hon
Male	376	120	11346	7150	371	2086
Female	521	141	2042	10826	348	1368

පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2018 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ. එයට අමතරව බන්ධනාගාර 16 කත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 02 කත් වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්විය

පුහුණු මධ්‍යස්ථාන	2016	2017	2018
ජාතික වෘත්තීය පුහුණු ආයතනය	07	07	07
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	22	22	22
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	203	198	191
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන බන්ධනාගාර හා පුනරුත්ථාපන	-	06	06
එකතුව	232	233	226



වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2018

පළාත	දිස්ත්‍රික්කය	ආයතන සංඛ්‍යාව						Total
		NVTI	DVTC	VTC	AT	PC	Reh	
බස්නාහිර	ගම්පහ	-	1	15	3	[1]	-	17
	කොළඹ	2	1	12	3	[1]	-	16
	කළුතර	-	1	8	1	1	-	09
වයඹ	පුත්තලම	-	1	6	-	-	-	07
	කුරුණෑගල	-	1	7	1	-	-	08
උතුර	යාපනය	-	1	5	0	-	-	06
	කිලිනොච්චිය	-	1	4	1	-	-	05
	මුලතිව්	-	1	2	1	-	-	03
	මන්නාරම	-	-	1	-	-	-	01
	වව්නියාව	-	1	2	4	-	[1]	04
නැගෙනහිර	ත්‍රිකුණාමලය	-	1	8	-	-	-	09
	මඩකලපුව	1	-	13	1	1	-	14
	අම්පාර	-	1	13	2	-	-	14
දකුණ	ගාල්ල	2	1	10	3	2	-	13
	මාතර	1	-	12	-	-	-	13
	හම්බන්තොට	1	1	10	-	1	-	13
සබරගමුව	කෑගල්ල	-	1	8	-	1	-	09
	රත්නපුරය	-	1	11	1	-	-	12
ඌව	බදුල්ල	-	1	8	-	[1]	-	09
	මොණරාගල	-	1	7	-	1	-	08
මධ්‍යම	මහනුවර	-	1	9	-	2	-	10
	මාතලේ	-	1	5	1	-	-	06
	නුවරඑළිය	-	1	4	-	-	-	05
උතුරු මැද	අනුරාධපුර	-	1	8	1	1	-	11
	පොලොන්නරුව	-	1	3	1	[1]	[1]	6
	එකතුව	7	22	191	24	14	2	226

NVTI - ජාතික වෘත්තීය පුහුණු ආයතන

DVTC - දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන

VTC - වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන

AT - අනුබද්ධිත

PC - බන්ධනාගාර

Reh - පුනරුත්ථාපන මධ්‍යස්ථාන

[ ] - පුහුණු මධ්‍යස්ථාන ලෙස TVEC ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන


ජාතික වෘත්තීය පුහුණු ආයතන
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
අනුබද්ධිත
බන්ධනාගාර
පුනරුත්ථාපන මධ්‍යස්ථාන
Jaffna
Kilinochchi
Mullaitivu
Mannar
Vavuniya
Anuradhapura
Trincomalee
Puttalam
Kurunegala
Polonnaruwa
Batticaloa
Matale
Kandy
Ampara
Gampaha
Kegalle
Nuwara Eliya
Badulla
Colombo
Moneragala
Kalutara
Ratnapura
Galle
Matara
Hambantota

වෘත්තීය පුහුණු පරීක්ෂණ පැවැත්වීම හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුවලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මගින් ඇගයීම් කර සහතිකපත් ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 5 කට අධික මුදලක් වැයකරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය පහත පරිදි වේ.

	වර්ගය	2016	2017	2018
01	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	18,000	19,354	> 100
02	ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ)	1,000	2,477	> 100
03	පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL)	1,200	1,441	> 100
	එකතුව	20,200	23,272	> 100

වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

තරුණ තරුණියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට මඟ පෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් කාර්තෘවයකි. ඒ සඳහා සුදුසුකම් ලත් නිළධාරි මණ්ඩලයක් විසින් යෞවන යෞවනියන්ගේ රුචිකත්වය හා සුදුසුකම්මත ඔවුනට ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තොරා ගැනීමට දීපව්‍යාප්තව වෘත්තීය මාර්ගොපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

ඉලක්කගත කණ්ඩායම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
පාසැල් සිසුන්	956	53315
පාසැල් හැරයන්නන්	513	28699
පුහුණුවන්නන්	790	35864
දෙමාපියන්	569	24192
වෙනත්	501	23391
එකතුව	3329	165461

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මඟින් 2018 වසර සඳහා පුහුණු ලාභීන් 8023 දෙනෙකු ශ්‍රම වෙළඳපොල අවශ්‍යතා සපුරාලීමට සෘජුව හා ස්වයං රැකියා තුලින් යොමු කිරීමට රැකියා ස්ථාපන ඒකකයට හැකිවිය.

රැකියාගත කිරීම

අංකය	පුහුණු ක්ෂේත්‍රය	රැකියා ගත කල සංඛ්‍යාව			
		දේශීය	විදේශීය	ස්වයං	එකතුව
01.	ගොඩනැගිලි හා ඉදිකිරීම්	868	12	140	1020
02.	මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව	723	20	82	825
03.	විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ	671	19	166	856
04.	ශීතකරණ හා වායු සමීකරණ	247	7	16	270
05.	ආහාර තාක්ෂණය	188	4	15	207
06.	සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය	1408	8	61	1477
07.	හෝටල් හා සංචාරක	666	18	14	698
08.	ලෝහ හා ලූහු ඉංජිනේරු	267	9	33	309
09.	දැව ආශ්‍රිත	167	1	40	208
10.	මැණික් හා ස්වර්ණාභරණ	22	-	2	24
11.	මුද්‍රණ හා ඇසුරුම්	49	1	0	50
12.	රෙදිපිළි හා ඇඟලුම්	732	3	385	1120
13.	පුද්ගල හා සමාජ	488	4	406	898
14.	කාර්යාල කළමනාකරණය	30	1	6	37
15.	ධීවර හා මත්ස්‍ය වගාව	16	-	0	16
16.	සම් ආශ්‍රිත නිෂ්පාදන	-	-	1	1
17.	කෘෂි වැවිලි	-	-	7	7
	එකතුව	6542	107	1374	8023

රැකියාගත කිරීම



රැකියාගත කිරීම



රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

වර්ගය	ස්ථාපනය කළ සංඛ්‍යාව	ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රු. මිලියන)
දේශීය රැකියා	6542	203.22
විදේශීය රැකියා	107	6.85
ස්වයං රැකියා	1374	39.92
එකතුව	8023	249.99

(තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සඟරාව හා රැකියාගත කළ ආයතනයන්හී දත්ත මත 2018 වර්ෂයේ රැකියාගත කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව වසරක කාලයක් සේවය කරනු ලැබූ බවට උපකල්පනය කර ඉපයූ ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.)

වර්ෂය	දේශීය	විදේශීය	ස්වයං	එකතුව
2016	5,091	204	757	6,052
2017	5,378	146	1,137	6,662
2018	6,542	107	1,374	8,023

(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් රැකියාගත කල තොරතුරු පමණි)

රැකියා ස්ථාපනය



රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	අනුග්‍රාහක ආයතන
ටයිල් ඇතිරීම	09	372	ලංකා ටයිල්ස් සමාගම
රූපලාවන්‍ය	11	1681	නේචර්ස් බියුටි ක්‍රියේෂන් ෆෝඑවර් ස්කින් නැවුරල්ස්
ඇලුමිනියම් පිරිසැකසුම්	7	282	ඇලුමෙක්ස් සමාගම ස්විස්ටෙක් ඇලුමිනියම්
යතුරු පැදි හා ත්‍රිරෝද රථ අළුත්වැඩියාව	3	165	ඩේවිඩ් පීරිස් සමාගම
විදුලි කාර්මික	1	100	AB මයුරි සමාගම කිල්ස් ෆුඩ්
දැව තාක්ෂණය	1	40	ACL කේබල්ස්
එකතුව	**32**	**2640**	

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

තරුණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීම හා ඔවුන්ට අත හිත දීම ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ.

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 36 ක් පවත්වා 719 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීම හා ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පුහුණුලාභීන් 139 ක් සඳහා රුපියල් මිලියන 61.39 ක් රාජ්‍ය බැංකු තුලින් ණය පහසුකම් ලබාදීම.

අභියෝග

- නොමිලේ වෘත්තීය අධ්‍යාපනය සැපයීම ආරම්භයත් සමඟ ඇති වී ඇති ඉල්ලුම සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය හා භෞතික සම්පත් හිඟවීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැතිවීම.
- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන මඟින් සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසුවීම මත දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදු වීම.
- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට හා ආකල්ප සංවර්ධනයට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- පුහුණු ක්ෂේත්‍ර හා රැකියා ඉල්ලුම අතර ඇති නොගැලපීම අවම කර ගැනීම.
- පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා දැනුම, හැකියාව, පළපුරුද්ද ඇති උපදේශකවරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.
- ගුණාත්මක පුහුණුවක් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය උපදේශක කාර්යය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් මට්ටමින් ඔවුන්ට නොලැබීම මත සේවය හැරයාමේ නැඹුරුවක් පැවතීම
- නවීන තාක්ෂණික පුහුණු ක්‍රමවේදයන් දැනට ක්‍රියාත්මක පාඨමාලා සඳහා අන්තර්ග්‍රහණය කිරීමට සම්පත් ප්‍රමාණවත් නොවීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විගණන හා කළමණාකරණ කමිටුව කාර්ය සාධනය 2018

2018 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර විගණන හා කළමණාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය පහත පරිදි වේ.

සමිටු සාමාජිකයන්

ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය	කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩ සාමාජික
නීතිඥ සමන් සේනාධීර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික
ආර්.ආර්.ඒ විමලවීර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික

2018.08.23 සිට

ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය	කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩ සාමාජික
නීතිඥ සමන් සේනාධීර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික
අරුණ බණ්ඩාර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික

2018.12.12 දින

ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය	කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩ සාමාජික
අරුණ බණ්ඩාර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික
ප්‍රතාප් ප්‍රනාන්දු මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික

විගණන හා කළමණාකරන කමිටුව විසින් 2018 වසරේ දී ගෙන ඇති වැදගත් තීරණ පහත පරිදි වේ.

- පවතින පිළිවෙත් හා පද්ධති පිළිබඳ විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු හා දුර්වලතාවයන් මඟහරවාගෙන පිළිවෙත් හා පද්ධති ශක්තිමත් කිරීම.
- රජයේ විගණන විමසුම් හා කෙටුම්පත් පිළිතුරු සමාලෝචනය කර පිළිතුරු සැකසීමේ ක්‍රමවේදය විධිමත් කිරීම.
- විගණන සැලසුම් හා විගණන වැඩසටහන සමාලෝචනය කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම.
- අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය හා අනෙකුත් කාර්යයන් ප්‍රඥස්ථ මට්ටමකින් පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

පෙරවදන

2018 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සමාලෝචනයට ලක්වන වසර තුළ රු. 2,224,973,880 ක සමස්ථ ප්‍රදානයක් භාණ්ඩාගාරය, අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය සහ වෙනත් ආයතන මගින් අධිකාරිය වෙත නිදහස් කර ඇත. එහි විස්තර පහත පරිදි වේ. ඊට අමතරව, අධිකාරිය විසින් අර්ධකාලීණ පාඨමාලා සඳහා ස්වකීය ආදායම් උපයා ඇත.

රජයේ ප්‍රදාන	වෙන් කිරීම් (රු.)	නිදහස් කළ මුදල (රු.)
භාණ්ඩාගාර ප්‍රතිපාදන - පුනරාවර්තන	1,485,000,000	1,446,600,000
ආදායම	61,752,319	61,752,319
E.P.F සහ E.T.F. සඳහා විශේෂ දීමනා (2006 - 2015)	33, 873,000	33,873,000
භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන	200,000,000	183,340,000
නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය	706,950,000	329,084,264
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය	164,945,756	164,945,756
වෙනත්	5,378,541	5,378,541
මුළු එකතුව	2,657,899,616	2,224,973,880

2018 දෙසැම්බර් 31 න් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.පහත සංයුතීන් මූල්‍ය ප්‍රකාශය සඳහා ඇතුළත් වේ.

01. 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
02. 2018 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශය
03. 2018 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
04. 2018 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් සඳහා ප්‍රකාශය
05. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

J.A.D.S. නිශාමනී
අධ්‍යක්ෂ මුදල් (වැඩබලන)

චූලාංගනී පෙරේරා
අධ්‍යක්ෂ ජෙනරාල්

දමිත වික්‍රමසිංහ
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

පාලක මණ්ඩලය වෙනුවෙන් සභාපතිවරයාගේ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2018 දෙසැම්බර් 31න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ සම්මතයන් අනුව සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ නිර්දේශිත පරිදි සකස් කර ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් යොදාගත් මූල්‍ය නීති රීති සහ ක්‍රියාපරිපාටින් අනුගමනය කර ඇති අතර, වත්කම්වල ආරක්ෂාව සහ ගණුදෙණුවල ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීමට ප්‍රායෝගික වන පරිදි පද්ධති සහ පාලන පවත්වාගෙන ඇත. 2018 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් සතුටුදායක ලෙස සකස් කර ඇති අතර, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්වය සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු කරයි.

.....
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

.....
අධ්‍යක්ෂ මණ්ඩලය

.....
අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළබඳ ප්‍රකාශය

	සටහන්	2018 (රු.)		2017 (රු.)	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල, පිරියත සහ උපකරණ	2	5,830,056,398.85		5,227,442,549.68	
ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ	3	115,235,502.89		211,008,032.78	
වෙනත් මූල්‍ය වත්කම්					
ස්ථාවර තැන්පතු		40,000,000.00	**5,985,291,901.74**		**5,438,450,582.46**
ජංගම වත්කම්					
තොගය	4	27,904,820.52		28,614,548.21	
ලැබීම්	5	113,672,700.51		90,640,452.75	
සේවක ණය	6	46,249,594.80		47,151,819.23	
මුදල් සහ මුදල් සමාන දෑ	7	153,866,894.02	**341,694,009.85**	62,377,124.97	**228,783,945.16**
මුළු වත්කම්			**6,326,985,911.59**		**5,667,234,527.62**
වගකීම්					
මූලධනය සහ වගකීම්					
සමුච්චිත අතිරික්තය(ඌණතාවය)		(929,679,627.94)		(800,736,885.49)	
ප්‍රත්‍යාගණනය තුල අතිරික්තය		2,483,219,190.99		2,319,991,544.97	
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	8	17,554,429.60		13,472,995.59	**5,145,099,502.82**
විලම්භිත ආදායම් ප්‍රදාන	9	4,007,794,657.66	**5,578,888,650.31**	3,612,371,847.75	
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	10	437,388,627.00	**437,388,627.00**	369,317,480.50	**369,317,480.50**
ජංගම වගකීම්					
ගෙවීම්	11	266,824,747.80		115,635,953.30	**152,817,544.30**
උපචිත වියදම්	12	43,883,886.48	**310,708,634.28**	37,181,591.00	
මුළු මූලධනය සහ වගකීම			**6,326,985,911.59**		**5,667,234,527.62**

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ අංක 14 - 29 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ ඒකාබද්ධ කොටසෙනි.

J.A.D.S. නිශාමනි
අධ්‍යක්ෂ මුදල් (වැඩබලන)

දමිත වික්‍රමසිංහ
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

චූලාංගනී පෙරේරා
අධ්‍යක්ෂ ජෙනරාල්

සහතික කිරීම

ඉහත මූල්‍ය ප්‍රකාශයන් 2018 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කටයුතුවල සහ 2018 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා එහි අතිරික්තය / (ඌණතතාවය) සත්‍ය සහ සාධාරණභාවයක් පෙන්නුම් කරන බවට අපි සහතික කරමු.

මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය වග කියනු ලැබේ.

කළමනාකරණ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශයන් අනුමත කර අත්සන් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල

අධ්‍යක්ෂ මණ්ඩල

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2018.12.31. දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

(ස්වාභාවය අනුව වියදම් වර්ගීකරණය කිරීම)

විස්තරය	සටහන්	2018 (රු.)	2018 (රු.)
මෙහෙයුම් ආදායම			
පුනරාවර්තන ප්‍රදාන - භාණ්ඩාගාරය		1,480,473,000.00	1,311,373,000.00
පුනරාවර්තන ප්‍රදාන - අමාත්‍යාංශය		-	124,146,500.00
විලම්භිත ආදායම් ප්‍රදාන		141,350,858.16	391,658,290.56
වෙනත් ආදායම්			
වෙනත් ආදායම්	13	17,564,571.78	15,585,489.59
නිෂ්පාදන ඒකක ආදායම (ශුද්ධ)	14	44,187,747.46	27,223,001.97
විශේෂ ව්‍යාපෘති සඳහා ලද ආධාර	15	195,649,018.02	170,201,432.45
මුළු ආදායම		**1,879,225,195.42**	**2,040,187,714.57**
මෙහෙයුම් වියදම්			
කාර්යමණ්ඩල වියදම්	16	1,166,516,572.98	1,178,946,782.88
ගමනාගමනය	17	16,937,635.07	16,854,072.80
සැපයුම් සහ පරිභෝජනය කරන ලද දෑ	18	32,811,472.24	38,894,473.76
නඩත්තු කටයුතු	19	32,424,798.38	31,781,580.92
ගිවිසුම් ගත සේවාවන්	20	171,602,514.21	162,318,073.91
පුහුණු ද්‍රව්‍ය		107,665,068.33	108,104,905.28
කාර්ය මණ්ඩල පුහුණු කිරීම		4,691,010.50	3,159,306.60
ප්‍රවර්ධනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය		14,381,460.84	18,764,912.42
රැකියා ගත කිරීම,පර්යේෂණ සහ ව්‍යවසායකත්වය	21	11,517,911.56	12,187,281.00
ක්ෂය වීම්		141,350,858.16	391,658,290.56
නැවත තක්සේරු කළ හානි		73,100,211.56	
වෙනත් මෙහෙයුම් වියදම්	22	39,401,314.37	39,268,294.68
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම	23	195,649,018.02	170,201,432.45
මූල්‍ය වියදම	24	121,787.51	163,513.16
මුළු මෙහෙයුම් ආදායම		**2,008,171,633.73**	**2,172,302,920.42**
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		**(128,946,438.31)**	**(132,115,205.85)**
සමුච්චිත අතිරික්තයේ / ඌණතාවයේ ප්‍රකාශනයන්			
පෙර වාර්තා කළ පරිදි ජනවාරි 01 දිනට		**(800,736,885.49)**	**(662,725,978.73)**
පෙර වර්ෂයේ ගැළපීම්	25	3,695.86	(5,895,700.91)
නැවත සඳහන් කළ පරිදි ජනවාරි 01 දිනට		**(800,733,189.63)**	**(668,621,679.64)**
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		**(128,946,438.31)**	**(132,115,205.85)**
දෙසැම්බර් 31 වන දිනට ශේෂය		**(929,679,627.94)**	**(800,736,885.49)**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2018 (Rs.)		2017 (Rs.)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
කාලසීමාව සඳහා අතිරික්තය / ඌණතාවය		**(128,946,438.31)**		**(132,115,205.85)**
පෙර වර්ෂයේ ගැලපීම				
පහත දෑ සඳහා ගැලපීම				
ක්ෂය වීම	141,350,858.16		391,658,290.56	
විලම්භිත ආදායම් ප්‍රදානවල ක්‍රමක්ෂය	(141,350,858.16)		(391,658,290.56)	
පාරිතෝෂික ප්‍රතිපාදන	81,550,013.98		74,985,951.80	
ගෙවන ලද පාරිතෝෂික	(13,478,867.48)		(11,820,425.80)	
නැවත තක්සේරු කළ හානි	73,100,211.56			
පෙර වර්ෂයේ ගැලපීම	3,695.86		(5,895,700.91)	
ලැබීම්වල වැඩි වීම / අඩු වීම	(23,032,247.76)		(57,858,880.40)	
සේවක ණයවල වැඩි වීම / අඩු වීම	902,224.43		(2,313,637.82)	
ගෙවීම්වල වැඩි වීම / අඩු වීම	151,188,794.50		(14,442,565.39)	
සමුච්චිත වියදමේ වැඩි වීම / අඩු වීම	6,702,295.48		11,835,483.73	
තොගය වැඩි වීම / අඩු වීම	709,727.69		(44,274.24)	
		277,645,848.26		**(5,554,049.03)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**148,699,409.95**		**(137,669,254.88)**
ආයෝජන ක්‍රියාකාරකම්				
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(653,837,272.87)		(289,613,789.28)	
ප්‍රගතියේ පවතින වැඩ	95,772,529.89		(120,778,481.29)	
ස්ථාවර තැන්පතු	(40,000,000.00)		25,000.00	
ආයෝජනය ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**(598,064,742.98)**		**(410,367,270.57)**
මූල්‍ය ක්‍රියාකාරකම්				
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	193,767,341.81		141,000,000.00	
වෙනත් ආදායම් ප්‍රදාන	347,087,760.27		310,928,527.17	
මූල්‍ය කටයුතුවල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**540,855,102.08**		**451,928,527.17**
මුදල් සහ මුදල් සමාන දෑ සඳහා ශුද්ධ වැඩි වීම /අඩු වීම		**91,489,769.05**		**(96,107,998.28)**
කාල සීමාව ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		**62,377,124.97**		**158,485,123.25**
කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ		**153,866,894.02**		**62,377,124.97**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් සඳහා ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රජයෙන් ලැබූ ප්‍රදානයන්	විලම්භිත ආදායම් ප්‍රතිපාදන	ප්‍රත්‍යාගණන අතිරික්තය	මුළු එකතුව
2017 ජනවාරි 1 දිනට ශේෂය	(662,725,978.73)	41,073,032.86	3,525,654,108.23	2,319,991,544.97	5,223,992,707.33
ආරම්භක ශේෂ ගැළපීම	(5,895,700.91)	(1,152,534.36)	-	-	(7,048,235.27)
නැවත සඳහන් කළ ආරම්භක ශේෂය	(668,621,679.64)	39,920,498.50	3,525,654,108.23	2,319,991,544.97	5,216,944,472.06
වසර තුළ ලැබූ ප්‍රදානයන්	-	141,000,000.00	-	-	141,000,000.00
විලම්භිථ ආදායම් ප්‍රදාන වලට මාරු කිරීම්	-	(167,447,502.91)	478,376,030.08	-	310,928,527.17
වසර සඳහා ක්‍රමක්ෂය	-	-	(391,658,290.56)	-	(391,658,290.56)
වර්ෂය සඳහා අතිරික්තය/ ඌණතාවයන්	(132,115,205.85)	-	-	-	(132,115,205.85)
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	(800,736,885.49)	13,472,995.59	3,612,371,847.75	2,319,991,544.97	5,145,099,502.82
2018 ජනවාරි 1 ශේෂය	(800,736,885.49)	13,472,995.59	3,612,371,847.75	2,319,991,544.97	5,145,099,502.82
ආරම්භක ශේෂ සකස් කිරීම්	3,695.86	10,427,341.81	-	-	10,431,037.67
නැවත සඳහන් කළ ආරම්භක ශේෂය	(800,733,189.63)	23,900,337.40	3,612,371,847.75	2,319,991,544.97	5,155,530,540.49
වර්ෂය තුළ ප්‍රදාන වර්ෂය තුළ ලද ප්‍රදාන	-	183,340,000.00	-	163,227,646.02	346,567,646.02
විලම්භිත ආදායම්ට මාරු කිරීම්	-	(189,685,907.80)	536,773,668.07	-	347,087,760.27
වසර සඳහා ක්‍රමක්ෂය	-	-	(141,350,858.16)	-	(141,350,858.16)
වර්ෂය සඳහා අතිරික්තය/ ඌණතාවය	(128,946,438.31)	-	-	-	(128,946,438.31)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	(929,679,627.94)	17,554,429.60	4,007,794,657.66	2,483,219,190.99	5,578,888,650.31

01 - ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.0 සංයුක්ත තොරතුරු

1.1 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 1995 අංක 12 පනත යටතේ ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

1.2 මෙම ආයතනයේ ප්‍රධාන ස්ථානය පිහිටා ඇත්තේ, අංක 354 / 2, "නිපුණතා පියස", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේය.

1.3 අධිකාරියේ ප්‍රධාන කාර්යය වනුයේ, වර්ෂය පුරා සිසුන්හට වෘත්තීය පුහුණුව ලබා දීමයි.

1.4 සාමාන්‍ය ප්‍රතිපත්තීන්

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශනයන් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන් සමඟ ශුද්ධ වත්කම්වල වෙනස්කම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්වලට අනුකූලව සකස් කර ඇත.

1.4.2 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතීන් පදනම් කර පිළියෙළ කර ඇත.

1.4.3 සැසඳුම් තොරතුරු

අධිකාරිය විසින් යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, පෙර වර්ෂයේ භාවිතා කළ ඒවාට ගැලපීම් කර ඇත. වර්තමාන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවන්හිදී, පෙර වර්ෂයේ අගයන් සහ බාංඩයන් නැවත සකස් කර ඇත.

1.4.4 පිටු අංක 04 – 25 හි මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්, මූල්‍ය ප්‍රකාශනයන්වල අන්තරික කොටසක් ලෙස සකස් වී ඇත.

1.4.5 ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශනයන්වල ඉදිරිපත් කර ඇති අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ. වැදගත් මූල්‍ය ප්‍රතිපත්තීන් පහත පෙන්නුම් කර ඇත.

1.4.6 ශේෂ පත්‍ර දිනයට පසු අවස්ථා
සකස් කිරීම් හෝ ගිණුම්වල හෙළිදරව් කිරීම් අවශ්‍ය දිනය ශේෂ පත්‍ර දිනය බැවින් අවස්ථාවන් පැන නොනැගිණි.

1.5 බදුකරණය

අධිකාරිය විසින් රජයේ ආධාර මත ක්‍රියාත්මකවන දැ මගින් ලාභ ඉපැයීමට අපේක්ෂා නොකරන බැවින්, ආදායම් සඳහා බදු සකස් කර
නොමැත.

1.5.1 විලම්භීත බදු

අධිකාරියේ බදු ප්‍රතිපත්තිය අනුව කාලයන් වෙනස්වීම සඳහා බලපාන බදු පැන නොනැගිණි. එමනිසා විලම්භීත බදුකරණය සපයා නොමැත.

1.5 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිණුම් පදනම්

1.6.1 දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම.

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමයක වියදම හඳුනා ගත යුත්තේ,

අ)වත්කම් ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ අනාගතයේ වෘත්තීය පුහුණු අධිකාරිය වෙත සම්ප්‍රේෂණය වනවිට,

ආ) වෘත්තීය පුහුණු අධිකාරියේ වත්කම් පිරිවැය විශ්වසනීය ලෙස මිණුම් කළ හැකිවිටය.

වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රාග්ධන සීමාව රු. 2,000 /- කි. කෙසේවුවද, දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම ප්‍රාග්ධන සීමාව මත පමණක් රඳා නොපවතින අතර, පහත සඳහන් කරුණුද සලකා බලනු ලැබේ.

(i) වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය
(ii) වත්කමේ අපේක්ෂිත අරමුණ
(iii) වත්කමේ කල්පැවැත්ම
(iv) වත්කම පරිභෝජනය කළ හැකිද / නොහැකිද යන අවස්ථාවන්හිදීය.

1.6.2 ඉන්වෙන්ටරි

යල් පැන ගිය සහ මන්ද වලන අයිතමයන් සඳහා නියමිත දීමනා සකස් කළ පසු අවම වියදම් සහ ශුද්ධ උපලබ්ධි අගය අනුව ඉන්වෙන්ටරි ගණනය කර ඇත. ඉන්වෙන්ටරි වර්තමාන පිහිටීමට සහ තත්වයට ගෙන ඒමට වියදම් කළ පිරිවැය පහත ආකාරයට FIFO පදනම මත ගණනය කර ඇත.

1. පුහුණු ද්‍රව්‍ය	-	පිරිවැයේදී
2. ලිපිද්‍රව්‍ය	-	පිරිවැයේදී
3. අමුද්‍රව්‍ය (මුද්‍රණ)	-	පිරිවැයේදී
4. වෙනත් පාරිභෝගික ද	-	පිරිවැයේදී

1.6.3. දේපල, පිරියත සහ උපකරණ

a) පිරිවැය හෝ අඩු සමුච්චිත ක්ෂයවීම් අගය මත දේපල, පිරියත සහ උපකරණ සඳහන් කර ඇත. දේපල, පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයන් ප්‍රතිස්ථාපනය, අපහරණය හෝ එය භාවිතයෙන් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවන් මත නැවත පිළිගෙන ඇත. වත්කම් නැවත පිළිගැනීමෙන් සිදුවන යම් ලාභ සහ හානි වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. වත්කම නැවත පිළිගෙන ඇත.

b) **ක්ෂය වීම්**

මිළදී ගත් වර්ෂයේ ක්ෂය වීම් අනුව ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත. පහත සඳහන් ක්ෂයවීමේ අගයන් යොදාගෙන ඇත.

ඛාණ්ඩය	**%**
ගොඩනැගිලි සහ දියුණු කිරීම්	5%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	25%
ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	10%
පුහුණු උපකරණ	20%
යන්ත්‍ර සහ පිරියත	20%
පරිගණක උපකරණ	20%
විදුලි උපකරණ	20%

c) සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යන් වැඩ වියදම් අනුව තක්සේරු කළ ව්‍යාපෘතීන් සම්පූර්ණ කර ඇත.

1.6.4 ලැබීම්

අවබෝධ කර ගැනීමට ඇස්තමේන්තු කළ මුදල්, නරක් වූ සහ සැකසහිත ලැබීම් සඳහා ප්‍රතිපාදනවල ශුද්ධ අගය මත ලැබීම් සඳහන් කර ඇත. දින 365 ඉක්මූ ණය වීම මත සැක සහිත ණය සඳහා ප්‍රතිපාදන සකස් කිරීම සිදු කර ඇත. එසේම, සම්පූර්ණ මුදලේ එකතුවේ සැකය ලෙස ගණනය වේ.

1.6.5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ බැංකුවේ පවතින මුදල් සහ අතැති මුදල් සහ ස්ථාවර බැංකු අයිරාවන්ය. වගකීම් සහ විධි විධානයන්

1.7.1 සියළුම දන්නා වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම තුළ ගණන් ගෙන තිබේ.

1.7.2 කාර්ය මණ්ඩලයේ විශ්‍රාම පාරිතෝෂිකය

සියළුම සේවකයන්ට අදාළව සේවයෙහි සෑම සම්පූර්ණ කළ අවුරුද්දකම මාසික වැටුපෙන් අර්ධයක් පදනම් කර විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා සුදුසුකම ගණනය කර ඇත.

කෙසේවුවද, 1983 අංක 12 දරන පනතේ පාරිතෝෂික ගෙවීම අනුව, සේවාවේ අවුරුදු 5 සම්පූර්ණ කිරීම මත පමණක් සුදුසුකම පැන නගී.

පාරිතෝෂික දීමනා සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය සම්පාදනය වන බැවින් මෙම දීමනා ප්‍රක්ෂේපිත මුදල් ඒකක ක්‍රමය මත තක්සේරු නොකෙරේ. මෙම දීමනාව සඳහා අරමුදල් නිර්මාණය නොකෙරේ.

1.7.3 අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාරත්ව අරමුදල

අදාළ තත්වයන් සහ විධිවිධානයන් අනුව සේවකයන් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයන් සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයන් සඳහා සුදුසකම් ලබයි.

1.7.4. රජයේ ආධාර සහ ප්‍රදානයන්

අ.) ආයතනය එහි වියදම් සඳහා යැපෙන රජයේ ආධාර රිසිට්පත් පදනම මත ගණනය කෙරේ. පුණාරාවර්ථන වියදම් සම්බන්ධ ප්‍රදානයන්, ආදායමේ මුදල් ලෙස ඉදිරිපත් කර ඇති අතර, ප්‍රාග්ධන වියදම් සම්බන්ධ වියදම් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර ඇත.

a) මූලික වශයෙන් වත්කම් සම්බන්ධව ප්‍රදානයන් සිදු කරන ආයතනයන්වලින් ලබන ප්‍රදානයන්, එය උපයෝජනය කරන තුරු බැරකමක් ලෙස පිළි ගැනේ. ප්‍රදානයන්ගෙන් උපයෝජනය කරන මුදල අර්ථ දක්වන ලද ආදායම් ගිණුමට හුවමාරු කරන ලද අතර, පසුව වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී හිලව් කරනු ලැබේ.

1.7.5 ප්‍රතිපාදන සහ ආවස්ථික වගකීම්

සම්පත්වල පිටත ගලා යාමක ප්‍රතිඵලයක් ලෙස යම් බැඳීමක් සිදු විය හැකි අවස්ථාවක සියළුම බැඳීම් සඳහා ප්‍රතිපාදනයන් පවතින ශේෂ පත්‍ර දිනයට සකස් කෙරෙන අතර, ගලනයේ කොටසකින් විශ්වාසදායි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි සියළුම ආවස්ථික පිරිවැටුම් සම්පත්වල පිටත ගලා යාම. දුරස්ථ නොවේ නම්, සටහන් අංක 27 යටතේ මූල්‍ය ප්‍රකාශයන්වල එය හෙළිදරව් කර ඇත.

1.8 ආදායම් වියදම් ප්‍රකාශය

1.8.1 ආදායම් හඳුනා ගැනීම.

අධිකාරිය වෙත ගලා ආ හැකි ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය මත ආදායම් හඳුනා ගන්නා අතර, වියදම් කර ඇති හෝ වියදම් කිරීමට පවතින ආදායම සහ ආශ්‍රිත වියදම් විශ්වාසදායක ලෙස මැණ බැලිය හැක. සැළකිය යුතු ලැබුණු දෑ හෝ ලැබීම්වල සාධාරණ අගය මත ආදායම් මැණ බැලේ.

ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිර්දේශිත නිර්ණායකයන් භාවිතා කෙරේ.

අ.) පුනරාවර්තන වියදම් සඳහා ලද ප්‍රදාන

පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් ආදායම ලෙස හඳුනා ගත හැක.

ආ.)මූලික වශයෙන් ප්‍රදානයන් සිදු කරනු ලබන ආයතනවලින් ලද ප්‍රදානයන් එය භාවිතා කරන තුරු පිරිවැටුමක් ලෙස පිළි ගැනේ. ප්‍රදානයන්ගෙන් උපයෝජනය කරනු ලබන මුදල, ආදායමට හුවමාරු කෙරේ.

ඇ.) පුහුණු පාඨමාලා වලින් ලද ආදායම

පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ ගාස්තු උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

ඈ.) ශිෂ්‍ය නිෂ්පාදන ඒකකයෙන් ලද ආදායම

ශිෂ්‍ය නිෂ්පාදන ඒකකයෙන් ලද ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

ඉ.)කුලී ආදායම

කුලි ආදායම කුලියට දුන් කාලය මත, උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

ඊ) අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

1.8.2 වියදම හඳුනා ගැනීම.

අ.)වියදම් කළ පිරිවැය සහ ආදායමේ නිර්දේශිත අයිතමයන්වල ඉපැයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කර ආදායම් සහ වියදම් ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂම ආකාරයකින් දේපල, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාමේදී දරන ලද වියදම් වර්ෂයේ ශුද්ධ අතිරික්තය සහ හිඟය කරා යාමේදී ආදායමට බැර කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

2. දේපල, පිරියත සහ උපකරණ

	සටහන	2018 නැවත තක්සේරු කිරීම රු.	2017 කපා හරින ලද වටිනාකම රු.
මෝටර් වාහන		187,802,750.00	50,674,107.85
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	2.1	215,374,974.38	239,596,278.63
පුහුණු උපකරණ	2.2	750,284,956.66	724,185,952.79
පරිගණක උපකරණ		103,426,200.31	152,305,107.62
		1,256,888,881.35	**1,166,761,446.89**

2.1 පහත සඳහන් දෑ ඇතුළුව ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ - වර්ගීකරණය අනුව

ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	98,258,578.73	182,147,544.46
කාර්යාල උපකරණ	117,116,395.65	57,448,734.17
	215,374,974.38	**239,596,278.63**

2.2 පහත සඳහන් දෑ ඇතුළුව පුහුණු උපකරණ - වර්ගීකරණය අනුව

පුහුණු උපකරණ	750,284,956.66	689,201,958.13
විදුලි උපකරණ	-	2,484,927.82
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	-	32,499,066.84
	750,284,956.66	**724,185,952.79**

2.3 ස්ථාවර වත්කම්වල වටිනාකම සැසඳීම

	2018.12.31. දිනට නැවත තක්සේරු කිරීම අනුව	2018.12.31 දිනට කපා හරින ලද වටිනාකම	වෙනස
මෝටර් වාහන	187,802,750.00	50,674,107.85	137,128,642.15
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	215,374,974.38	239,596,278.63	(24,221,304.25)
පුහුණු උපකරණ	750,284,956.66	724,185,952.79	26,099,003.87
පරිගණක උපකරණ	103,426,200.31	152,305,107.62	(48,878,907.31)
	1,256,888,881.35	**1,166,761,446.89**	**90,127,434.46**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

2 දේපල, පිරියත සහ උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම්	මෝටර් වාහන	ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	පුහුණු උපකරණ	පරිගණක උපකරණ	මුළු එකතුව
වියදම හෝ තක්සේරු කිරීම							
වර්ෂය ආරම්භයේ	1,760,857,327.81	3,370,822,978.49	-	-	-	-	5,131,680,306.30
නැවත තක්සේරු කිරීම			187,802,750.00	215,374,974.38	750,284,956.66	103,426,200.31	1,256,888,881.35
වර්ෂය තුළ එකතු වීම්	15,799,079.13	452,201,600.55	1,656,387.57	42,711,329.72	103,925,608.70	37,543,267.20	653,837,272.87
වර්ෂය අවසානයේ	**1,776,656,406.94**	**3,823,024,579.04**	**189,459,137.57**	**258,086,304.10**	**854,210,565.36**	**140,969,467.51**	**7,042,406,460.52**
සමුච්චිත ක්ෂය වීම්							
වර්ෂය ආරම්භයේ	-	1,070,999,203.51	-	-	-	-	1,070,999,203.51
වර්ෂය සඳහා අය කිරීම්		129,415,710.70	367,577.34	2,022,300.78	7,660,442.73	1,884,826.61	141,350,858.16
වර්ෂය අවසානයේ	**-**	**1,200,414,914.21**	**367,577.34**	**2,022,300.78**	**7,660,442.73**	**1,884,826.61**	**1,212,350,061.67**
කපා හරින ලද අගයන්							
2018 දෙසැම්බර් 31 දිනට	1,776,656,406.94	2,622,609,664.83	189,091,560.23	256,064,003.32	846,550,122.63	139,084,640.90	5,830,056,398.85
2017 දෙසැම්බර් 31 වන දිනට	1,760,857,327.81	2,299,823,774.98	50,674,107.85	239,596,278.63	724,185,952.79	152,305,107.62	5,227,442,549.68

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

2.2 තක්සේරු නොකළ ඉඩම් සහ ගොඩනැගිලි

1. තක්සේරු කර නොකර ඇති බැවින්, පහත සඳහන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ඉඩම් සහ ගොඩනැගිලි වාර්ෂික ගිණුම්වල ඇතුළත් වී නොමැත.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මාතලේ - මාතලේ
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යක්කලමුල්ල - මාතලේ - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගිනිමැල්ලගහ - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - අක්මීමණ - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වතුරවි - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කටාන - ගම්පහ
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කිරින්ද - හම්බන්තොට
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - සිරබෝපුර - හම්බන්තොට

ඉහත සඳහන් ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරු කිරීම් සිදු කෙරෙමින් පවතින අතර, තක්සේරුවන් ලබා ගත් පසු, එම අගයන් 2018 වසර සඳහා ගිණුම්ගත කෙරෙනු ඇත.

2. වෘත්තීය පුහුණු අධිකාරියට අයත් නොවන ඉඩම්වල නිපුණතා සංවර්ධන අරමුදලේ ආධාර මගින් පහත සඳහන් ගොඩනැගිලි ඉදි කෙරේ. ඉහත ඉඩම්වල සහ ගොඩනැගිලිවල තක්සේරු කිරීම් 2018 වසරේදී ඇතුළත් වනු ඇත.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - බිංගිරිය - කුරුණෑග - හම්බන්තොට
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ - ගම්පහ
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යක්කලමුල් - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නියාගම - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රුවන්වැල් - කෑගල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කන්තලේ - ත්‍රිකුණාමලය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හම්බන්තොට - හම්බන්තොට
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වස්කඩුව - කළුතර
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හල්දුම්මුල් - බදුල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වැලිමඩ - බදුල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වැල්ලවාය - මොණරාගල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - බිබිල - මොණරාගල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මිහින්තලේ - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගල්නෑව - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - තඹුත්තේගම - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රාජාංගනය - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මින්නේරිය - පොළොන්නරුව
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යටියන්තොට - කෑගල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කිලිනොච්චිය - යාපනය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රත්මලාන - කොළඹ

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018 රු.	2017 රු.
3. <u>ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ - ගොඩනැගිලි</u>			
අම්පාර		-	99,442.00
අනුරාධපුරය		-	17,636,270.56
බදුල්ල		334,750.50	5,980,021.34
මඩකලපුව		158,850.00	158,850.00
කොළඹ		2,811,638.29	2,811,638.29
ගම්පහ		-	15,451,056.64
ගාල්ල		10,511,167.47	54,125,144.87
හම්බන්තොට		19,053,095.65	19,053,095.65
යාපනය		-	5,372,084.95
මහනුවර		1,926,156.00	597,183.96
කළුතර		3,964,497.60	11,803,640.99
කෑගල්ල		27,976,749.74	11,006,826.00
කුරුණෑගල		20,976,077.02	11,197,276.48
මාතර		-	431,662.03
මාතලේ		5,186,260.25	5,186,260.25
මොනරාගල		-	27,280,161.07
නුවර එළිය		21,456,853.94	14,857,478.63
රත්නපුරය		879,406.43	7,959,939.07
		115,235,502.89	**211,008,032.78**
4. <u>තොගය</u>			
පුහුණු ද්‍රව්‍ය		21,573,634.45	21,156,683.90
ලිපි ද්‍රව්‍ය		5,166,462.07	6,050,791.05
අනෙකුත් පරිභෝජනයන්		1,164,724.00	1,407,073.26
		27,904,820.52	**28,614,548.21**
5. <u>ලැබිය යුතු</u>			
වැඩසටහන් සඳහා අත්තිකාරම්		39,920.00	60,250.00
ඉඩම් සඳහා අත්තිකාරම් ගෙවීම්		37,034,992.50	18,032,000.00
ඉදිකිරීම් සඳහා සේවයෙහි යෙදවීම්		10,810,226.46	51,104,293.87
වෙනුවෙන් අත්තිකාරම්			
අනිවාර්ය දෑ සඳහා තැන්පතු		3,227,736.75	
තැන්පතු		864,750.00	559,750.00
වෘත්තීය පුහුණු සහ		3,548,334.94	3,548,334.94
ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය			
පාඨමාලා ගාස්තු ලැබීම්		17,172,700.00	17,141,025.00
වැටුප් ලැබීම්		563,415.31	355,573.67
ආදායමේ ඌණතාවයන්		11,732.00	11,732.00
රාජ්‍ය සංවිධානයන්		1,964,635.71	1,964,635.71
වෙළඳ හා වෙනත් ලැබීම්		43,684,369.07	3,233,673.21
පූර්ව ගෙවීම්		149,823.42	
වාහන සේවා ආදායම් ලැබීම්		113,035.00	142,155.00
		119,185,671.16	**96,153,423.40**
අඩු කළා : බොල් ණය සඳහා ප්‍රතිපාදන		(5,512,970.65)	(5,512,970.65)
		113,672,700.51	**90,640,452.75**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018 රු.	2017 රු.
6. සේවක ණය			
වර්ෂය ආරම්භයේ ශේෂය		47,151,819.23	44,838,181.41
එකතු කළා: වර්ෂය තුළ ප්‍රදානය කළ ණය		45,772,869.76	48,626,012.02
		92,924,688.99	**93,464,193.43**
අඩු කළා : වර්ෂය තුළ නැවත ගෙවීම්		(46,675,094.19)	(46,312,374.20)
වර්ෂය අවසානයේ ශේෂය		**46,249,594.80**	**47,151,819.23**
7. මුදල් සහ මුදල් සමාන දෑ			
රන් කාසි		104,000.00	104,000.00
බැංකුවේ පවතින මුදල්			
අතැති මුදල්		1,898.10	30,120.00
අතැති චෙක් පත්		280,200.00	123,600.50
මහජන බැංකුව		153,480,795.92	62,119,404.47
		153,866,894.02	**62,377,124.97**

සෙලාන් බැංකුවේ තැගි ලෙස රන් කාසි 02 ක් අධිකාරිය වෙත ලැබිණි. එක් රන් කාසියක බර ග්‍රෑම් 8.02 වන අතර එක් රන් කාසියක වටිනාකම කැරට් 22.03 කි.

8. රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන			
වර්ෂය ආරම්භයේ ශේෂය		13,472,995.59	41,073,032.86
අඩු කළා - ආරම්භක ශේෂ ගැළපීම		10,427,341.81	(1,152,534.36)
නැවත සඳහන් කළ පරිදි ශේෂය		**23,900,337.40**	**39,920,498.50**
එකතු කළා - වර්ෂය තුළ ලද ප්‍රදානයන්		183,340,000.00	141,000,000.00
		207,240,337.40	**180,920,498.50**
අඩු කළා : විලම්භීත ආදායම් ප්‍රදාන වලට මාරු කිරීම්		(189,685,907.80)	(167,447,502.91)
වර්ෂය අවසානයේ ශේෂය		**17,554,429.60**	**13,472,995.59**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018 රු.	2017 රු.
9. විලම්බිත ආදායම් ප්‍රදාන			
වර්ෂය ආරම්භයේ ශේෂය		3,612,371,847.75	3,525,654,108.23
එකතු කළා - වර්ෂය තුළ මාරු කිරීම්	9.1	536,773,668.07	478,376,030.08
		4,149,145,515.82	**4,004,030,138.31**
අඩු කළා - වසර සඳහා ක්‍රමක්ෂය		(141,350,858.16)	(391,658,290.56)
එකතු කළා - ආරම්භක ශේෂ ගැළපීම			
වර්ෂය අවසානයේ ශේෂය		**4,007,794,657.66**	**3,612,371,847.75**
9.1 විලම්බිත ආදායමට මාරු කිරීම්			
රජයේ ප්‍රදානයන් - ප්‍රාග්ධන		189,685,907.80	167,447,502.91
SSDP ප්‍රදානයන්		315,102,728.25	287,031,140.77
වෙනත් ප්‍රදානයන්		31,985,032.02	23,897,386.40
		536,773,668.07	**478,376,030.08**
10. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන			
වසර ආරම්භක ශේෂය		369,317,480.50	306,151,954.50
එකතු කළා - වසර තුළ ප්‍රතිපාදන වෙන් කිරීම		81,550,013.98	74,985,951.80
		450,867,494.48	**381,137,906.30**
අඩු කළා - වර්ෂය තුළ ගෙවීම්		(13,478,867.48)	(11,820,425.80)
වර්ෂය අවසානයේ ශේෂය		**437,388,627.00**	**369,317,480.50**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018 රු.	2017 රු.
11. ගෙවීම්			
විගණන ගාස්තු		1,113,163.00	1,493,435.00
පාඨමාලා ගාස්තු ගෙවීම්		481,550.00	801,552.40
තැන්පතු		111,000.00	111,000.00
සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල		14,459,097.45	15,175,420.51
සේවක භාරකාර අරමුදල		2,169,151.72	2,276,313.78
දේශක ගාස්තු		7,402,208.50	6,719,687.50
වෙනත් ගෙවීම්		15,770,213.38	7,668,475.42
යෞවන කටයුතු සහ නිපුණතා සං. අමාත්‍යාංශය - වසර 13		148,289,641.92	-
ව්‍යාපෘති අරමුදල් ගෙවීම්		2,234,109.00	14,114,848.97
අත්තිකාරම් ලැබීම්		1,164,775.00	544,575.00
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		1,916,165.01	1,621,303.51
රඳවා ගැනීමේ මුදල්		27,493,622.18	20,474,765.13
වැටුප් ගෙවීම්		1,442,782.77	1,328,976.79
කාර්ය මණ්ඩල දිරිදීමනා ගෙවීම්		221,000.00	124,050.00
ශිෂ්‍ය රක්ෂණ ක්‍රමය	11.1	37,872,250.00	37,883,500.00
වෙළඳ ණයගැතියන්		4,638,675.87	5,186,177.93
W & O.P		45,342.00	111,871.36
		266,824,747.80	**115,635,953.30**
11.1 ශිෂ්‍ය රක්ෂණ ක්‍රමය			
වර්ෂය ආරම්භයේ		37,883,500.00	38,354,000.00
එකතු කළා : වර්ෂය තුළ දායකත්වයන්		-	37,000.00
		37,883,500.00	**38,391,000.00**
අඩු කළා : වර්ෂය තුළ ගෙවීම්		(11,250.00)	(507,500.00)
වර්ෂය අවසානයේ ශේෂය		**37,872,250.00**	**37,883,500.00**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018 රු.	2017 රු.
12. උපචිත වියදම්			
වෘත්තීය මාර්ගෝපදේශනය		200,773.16	167,930.00
විදුලි බලය		3,571,955.92	2,704,517.47
විභාග සහ ඇගයීම්		1,799,127.00	343,142.00
ඉන්ධන සහ ලිහිසි තෙල්		9,113.75	99,000.00
සනීපාරක්ෂක සේවා		1,066,875.00	1,164,190.00
නඩත්තු කිරීම්		2,465,045.53	1,888,912.81
පුවත්පත් සහ වාර සඟරා		41,250.00	15,770.00
සේවාස්ථ පුහුණුව සඳහා ගෙවීම්		692,750.00	153,500.00
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්		2,210,023.06	970,857.54
අර්ධ කාලීන වියදම් ගෙවීම්		16,052,285.17	19,092,252.77
ප්‍රවර්ධන කටයුතු		1,279,378.00	350,901.00
කුලී, වරිපනම් සහ බදු		790,334.36	299,025.84
වාර ප්‍රවේශ ගාස්තු		1,514,767.49	1,503,392.24
ආරක්ෂක සේවා ගාස්තු		3,663,057.30	3,261,194.82
දීමනා		3,792,200.00	2,509,000.00
දුරකථන		2,890,618.16	1,398,632.46
ප්‍රවාහනය		178,050.00	34,000.00
ගමනාගමනය		826,968.45	663,254.10
ජලය		839,314.13	562,117.95
		43,883,886.48	**37,181,591.00**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන	2018	2017
		රු.	රු.
13. වෙනත් ආදායම්			
වෙන්දේසි ආදායම්		1,762,155.70	1,907,145.18
පාඨමාලා ගාස්තු		1,095,000.00	1,782,800.00
ආපනශාලා ආදායම්		356,500.00	247,625.00
සමාගම් ලියාපදිංචි කිරීම්		23,000.00	66,500.00
දෛනික වැඩ ලේඛන		800.00	2,000.00
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්		122,000.00	134,000.00
දඩ		2,878,734.96	766,404.86
ශාලා ආදායම		1,423,025.00	1,224,450.00
නේවාසිකාගාර ගාස්තු		11,000.00	286,500.00
කතරගම සංචාරක බංගලාව		496,060.00	439,230.00
ණය වාරික		1,954,406.26	1,892,726.47
විවිධ		5,082,779.85	2,200,308.00
ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පතු		532,500.00	506,500.00
වාර්තා පොත්		-	5,000.00
ලියාපදිංචි ගාස්තු		11,700.00	34,800.00
විකණීම් අවසන් භාණ්ඩ		398,500.48	358,352.85
ඉතුරුම් ගිණුම් පොලී		1,239,809.53	1,661,747.23
සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම්		89,100.00	944,500.00
ඉංග්‍රීසි පොත් ආදායම්		87,500.00	580,200.00
විභාග ගාස්තු		-	544,700.00
		17,564,571.78	**15,585,489.59**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන	2018	2017
		රු.	රු.
14. නිෂ්පාදන ඒකක ආදායම			
ඉපයීම් 10%		1,783,483.91	894,310.50
අර්ධකාලීන පාඨමාලාවලින් ආදායම		29,880,481.26	17,920,717.96
මුද්‍රණ පාසල - නාරාහේන්පිට		390,449.20	72,698.93
පෙර ඉගැනුම් හඳුනා ගැනීම (RPL)		11,117,238.11	7,484,909.48
වෘත්තීය පරීක්ෂණ		-	23,444.00
තලල්ල රෙස්ටුරන්ට්		-	96,709.31
වාහන සේවා		6,975.00	62,040.00
වෙනත් නිෂ්පාදන ආදායම		1,009,119.98	668,171.79
		44,187,747.46	**27,223,001.97**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018	2017
		රු.	රු.
15. විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර			
යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - උසස් පෙළ සිසුන් සඳහා වැඩසටහන		-	41,300.00
ලෝක නිපුණතා දිනය වැඩසටහන		281,300.00	-
ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය		189,957,728.77	141,890,720.82
GIZ ආධාර		108,155.00	74,260.00
ILO ආධාර		129,900.00	2,272,720.17
මහවැලි අධිකාරියේ ආධාර		4,000,000.00	-
WUSC ව්‍යාපෘතියේ ආධාර		122,000.00	2,703,288.00
අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගොපදේශන ආධාර		119,450.00	-
සටන්කරුවන් පුනුරුප්ථාපනය කිරීමේ අරමුදල		609,486.00	-
අමාත්‍යාංශය සඳහා ආධාර - වසර 13		312,748.25	-
ලෝක ආහාර සංවිධානය සඳහා ආධාර		8,250.00	-
අයවැය යෝජනා සඳහා ආධාර		-	23,215,188.46
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ආධාර		-	3,955.00
		195,649,018.02	**170,201,432.45**
16. කාර්ය මණ්ඩල වියදම			
සේ.අ.අ. සහ සේ.නි.හා.අ.		163,482,396.56	202,544,440.55
සේ.නි.හා.අ. අධිභාරය		5,641,480.00	-
වෙනත් දීමනා		251,094,018.05	341,168,211.00
වැටුප් සහ අතිකාල		664,748,664.39	560,248,180.53
කාර්ය මණ්ඩල පාරිතෝෂිකය		81,550,013.98	74,985,950.80
		1,166,516,572.98	**1,178,946,782.88**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018	2017
		රු.	රු.
17. ගමනාගමනය			
නවාතැන් වියදම්		671,249.00	473,310.00
දේශීය		7,664,002.68	7,013,762.10
විදේශීය		6,158,098.39	7,346,403.20
භාණ්ඩ සමීක්ෂණ වියදම		2,444,285.00	2,020,597.50
		16,937,635.07	**16,854,072.80**
18. සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය			
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		18,831,710.93	15,619,887.73
වෙනත්		2,039,971.94	2,012,302.04
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා		10,951,483.17	15,037,198.50
මුද්‍රණ ද්‍රව්‍ය		988,306.20	6,225,085.49
		32,811,472.24	**38,894,473.76**
19. නඩත්තු සේවා			
ගොඩනැගිලි		10,505,478.82	11,575,232.28
කාර්යාල උපකරණ		896,340.32	834,578.21
පිරියත සහ යන්ත්‍ර සූත්‍ර		8,901,942.42	6,845,968.13
වාහන		12,121,036.82	12,525,802.30
		32,424,798.38	**31,781,580.92**
20. ගිවිසුම්ගත සේවා			
වෙළඳ දැන්වීම්		3,324,218.75	4,318,234.50
විගණන ගාස්තු		1,200,000.00	500,000.00
උපදේශන සහ වෘත්තීය ගාස්තු		-	707,201.93
විදුලි බලය		53,303,348.88	49,697,300.81
කුලී ගාස්තු		4,251,920.00	3,851,087.32
රක්ෂණය		2,974,536.56	3,578,375.74
සනීපාරක්ෂක සේවා		13,070,560.74	11,844,076.00
පුවත්පත් සහ වාර සඟරා		533,867.50	491,002.00
තැපැල් ගාස්තු		1,378,554.83	1,270,647.10
කුලී, වරිපනම් සහ බදු		8,808,218.26	7,576,249.70
ආරක්ෂක සේවා ගාස්තු		42,241,631.59	38,504,707.03
සේවක සුභසාධනය සහ වෙනත්		4,385,837.00	2,340,367.00
දුරකථන ගාස්තු		23,142,540.54	23,730,250.74
ප්‍රවාහනය		2,252,901.39	2,950,982.00
ජලය		10,734,378.17	10,957,592.04
		171,602,514.21	**162,318,073.91**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

	සටහන	2018 රු.	2017 රු.
21. රැකියාගත කිරීම්, පර්යේෂණ සහ ව්‍යවසායකත්වයන්			
විෂයමාලා සංවර්ධනය		483,700.00	504,705.00
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය		9,199,500.00	9,107,155.00
ව්‍යවසායකත්ව වැඩසටහන්		517,488.16	819,189.51
රැකියාගත කිරීම්		681,435.40	712,442.89
පරියේෂණ සහ අන්වේශ්‍ය අධ්‍යයනය		75,541.00	294,770.00
රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය		560,247.00	749,018.60
		11,517,911.56	**12,187,281.00**
22. වෙනත් මෙහෙයුම් වියදම්			
විභාග සහ ඇගයීම්		3,405,293.00	3,644,629.00
ප්‍රසාද දීමනා		453,550.00	647,600.00
නීති ගාස්තු		240,276.00	172,250.00
විවිධ		6,159,823.87	6,058,840.32
තත්ත්ව කළමනාකරණ ප්‍රතීතනය		1,408,085.10	2,294,508.07
වාර ප්‍රවේශ පත්‍ර		6,195,875.78	5,733,874.03
විශේෂ පුහුණු වැඩසටහන්		435,873.00	335,586.00
වැටුප් දීමනා		19,352,250.00	19,341,763.00
මෙවලම් සහ පරිභෝජනයන්		1,616,458.62	992,384.26
පුහුණු අධීක්ෂණය		133,829.00	46,860.00
		39,401,314.37	**39,268,294.68**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන	2018	2017
		රු.	රු.
23. විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්			
යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - උසස් පෙළ සිසුන් සඳහා වැඩසටහන		-	41,300.00
ලෝක නිපුණතා දිනය වැඩසටහන		281,300.00	-
ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය		189,957,728.77	141,890,720.82
GIZ සඳහා වියදම		108,155.00	74,260.00
ILO සඳහා වියදම		129,900.00	2,272,720.17
මහවැලි අධිකාරිය සඳහා වියදම		4,000,000.00	-
WUSC ව්‍යාපෘතිය සඳහා වියදම		122,000.00	2,703,288.00
අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා වියදම		119,450.00	-
සටන් කරුවන් පුනරුත්ථාපනය කිරීමේ වියදම		609,486.00	-
අමාත්‍යාංශය සඳහා වියදම - වසර 13		312,748.25	-
ලෝක ආහාර සංවිධානය සඳහා වියදම		8,250.00	-
අයවැය යෝජනා සඳහා වියදම		-	23,215,188.46
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වියදම		-	3,955.00
		195,649,018.02	**170,201,432.45**
24. මූල්‍ය වියදම			
බැංකු අය කිරීම්		121,787.51	163,513.16
		121,787.51	**163,513.16**

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන

25. පෙර වර්ෂය සඳහා ගැලපුම

පහත සඳහන් වියදම්වල වැඩි සහ අඩු ප්‍රතිපාදන පෙර වසරේ ගැලපුම් ලෙස ගලපා ඇත.

විස්තරය	හර	බැර	ශුද්ධ ලාභය
කාර්ය මණ්ඩල පුහුණු කිරීම	-	500,000.00	-
වැඩි ප්‍රතිපාදන	-	288,545.86	-
පාඨමාලා හැරයාම් - අර්ධකාලීන	784,850.00	-	-
මුළු එකතුව	**784,850.00**	**788,545.86**	**3,695.86**

ඉහත ගැලපුම්වල ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරට අදාළ රු. 132,115,205.85 ක අතිරික්තය, 2018 වසරේ රු. 132,111,509.99 ක් ලෙස අඩුවනු ඇත.

26. වගකීම් සහ ආවස්ථිකයන්

අ. අධිකාරියට එරෙහි නඩු පැවරීම්

විභාග වෙමින් පවතින නඩු විභාග කිරීම් පහත පරිදි වේ.

උසාවිය	2018.12.31	2017.12.31
ශ්‍රේෂ්ඨාධිකරණය	1	2
අභියාචනාධිකරණය	1	1
මහාධිකරණය	1	-
දිස්ත්‍රික් උසාවිය	1	-
කම්කරු විනිශ්චයාධිකරණය	1	2
කම්කරු දෙපාර්තමේන්තුවේ විමර්ශන කිරීම්	-	1
එකතුව	**5**	**6**

ආ. ප්‍රාග්ධන වගකීම්

2018.12.31.න දිනට ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන වගකීම් නොමැත.

27. දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනයට ගත නොහැකි අයිතමයන්ගේ වියදම ගැලපීම

2013, 2014, 2015, 2016, 2017 සහ 2018 වසරවල පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයන්වලදී වෙන්දේසි කළ යුතු භාණ්ඩ හඳුනාගත් අතර, ඉන් සමහර අයිතමයන් 2014, 2015, 2016, 2017 සහ 2018 යන වසරවල වෙන්දේසි කිරීම සහ විනාශ කිරීම සිදු කර ඇත. එම අයිතමයන්වල පොත් වටිනාකම 2019 වසරේ දේපල, පිරියත සහ උපකරණ (ස්ථාවර වත්කම්) සඳහා ගලපනු ඇත.

28. බොල්ණය ප්‍රතිපාදන

රු. 5,512,970.65 ක බොල් ණය ප්‍රතිපාදන අතරින් රු. 3,548,334.94 ක මුදල යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙන් නියමිත අතර, ආරක්ෂක සේවා ලැබීම් සඳහා තීරණයක් අපේක්ෂාවෙන් සිටී.

29. විවිධ ආදායම්

කොන්ත්‍රාත් නීති කඩ කිරීම මත පෙට්ටිගල වත්ත සහ කයිකාවල ඉදිකිරීම් වැඩ අවසන් කරන ලද අතර, එම කොන්ත්‍රාත්කරුවන් දෙපලගේ කාර්යසාධන ගිවිසුම්, විවිධ ආදායම් ශීර්ෂය යටතේ මුදල් බවට හරවන ලදී.

30. E.P.F සහ E.T.F දායකත්වය

ජීවන වියදම් දීමනාවලට අදාළ 2006 ජනවාරි සිට 2015 මැයි දක්වා සේවකයන්ගේ E.P.F සහ E.T.F දායක මුදල් සඳහා ගෙවීම් දැනටමත් සිදු කර ඇත.
2018 වසරේ ගෙවන ලද වාරික 5 අතරින් E.T.F. සඳහා අතිරික්තයක් පවතින අතර, රු. 7,898,073.41 වන තවත් වාරික 7 ක් තවමත් ගෙවීමට ඇත.

31. කාල සීමාව සඳහා ශුද්ධ ඌනතාවය

2018 වසර සඳහා මූල්‍ය ප්‍රකාශයේ රු. මිලියන 55 ක ඌනතාවයක් පවතින අතර, එම හිඟය සඳහා පහත සඳහන් කරුණු හේතුවේ.

වියදම ලෙස රු. මිලියන 81 ක පාරිතෝෂික ප්‍රතිපාදන දැනටමත් අඩු කර ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	හර	බැර
ක්ෂය වීම්		
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම		
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අත්පත්කර ගැනීම	1,776,656,406.94	
ගොඩනැගිලි සහ ගොඩනැගිලි සංවර්ධන අත්පත්කර ගැනීම	3,823,024,579.04	
පරිගණක උපකරණ අත්පත්කර ගැනීම	140,969,467.51	
ගෘහභාණ්ඩ සහ සවි කිරීම් අත්පත්කර ගැනීම	258,086,304.10	
මෝටර් වාහන අත්පත්කර ගැනීම	189,459,137.57	
පුහුණු උපකරණ අත්පත්කර ගැනීම	854,210,565.36	
ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		
ගොඩනැගිලි සහ ගොඩනැගිලි සංවර්ධන සඳහා ක්ෂය වීම් ප්‍රතිපාදන		1,200,414,914.21
පරිගණක උපකරණ සඳහා ක්ෂය වීම් ප්‍රතිපාදන		1,884,826.61
ගෘහභාණ්ඩ සහ සවි කිරීම් ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		2,022,300.78
මෝටර් වාහන ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		367,577.34
පුහුණු උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		7,660,442.73
ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ		
කෙරෙමින් පවතින වැඩ - ගොඩනැගිලි ව්‍යුහයන්	115,235,502.89	
ආයෝජනයන්		
ස්ථාවර තැන්පතු	40,000,000.00	
ආයෝජනයන්		
පුහුණු ද්‍රව්‍ය	21,573,634.45	
ලිපි ද්‍රව්‍ය	5,166,462.07	
වෙනත් පරිභෝජනයන්	1,164,724.00	
වෙනත් ලැබීම්		
වැඩසටහන් සඳහා අත්තිකාරම්	39,920.00	
ඉඩම් සඳහා අත්තිකාරම් ගෙවීම්	37,034,992.50	
ඉදිකිරීම් සඳහා සේවයෙහි යෙදවීම් වෙනුවෙන් අත්තිකාරම්	10,810,226.46	
අනිවාර්ය දෑ සඳහා තැන්පතු	3,227,736.75	
තැන්පතු	864,750.00	
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	3,548,334.94	
වාහන සේවා ආදායම් ලැබීම්	113,035.00	
පාඨමාලා ගාස්තු ලැබීම්	17,172,700.00	
වැටුප් ලැබීම්	563,415.31	
ආදායම් ඌණතාවයන්	11,732.00	
රාජ්‍ය සංවිධාන	1,964,635.71	
වෙළඳ හා වෙනත් ලැබීම්	43,684,369.07	

විස්තරය	හර	බැර
පෙර ගෙවීම්	149,823.42	
බොල් ණය සඳහා ප්‍රතිපාදන		5,512,970.65
සේවක ණය		
ආපදා ණය	45,693,844.80	
උත්සව අත්තිකාරම්	555,750.00	
මුදල් සහ මුදල් සමාන දෑ		
රන් කාසි	104,000.00	
බැංකු ගිණුම්		
අම්පාර	155,249.60	
අනුරාධපුරය	484,012.65	
බදුල්ල	295,565.32	
මඩකලපුව	675,606.83	
කොළඹ	305,133.65	
ගාල්ල	414,596.22	
ගම්පහ	94,696.41	
හම්බන්තොට	8,215.77	
ප්‍රධාන කාර්යාලය	142,926,624.51	
යාපනය	569,211.87	
කළුතර	118,893.73	
මහනුවර	75,178.38	
කෑගල්ල	40,732.88	
කිලිනොච්චිය	526,188.12	
කුරුණෑගල	158,267.41	
මාතලේ	1,025,618.61	
මාතර	32,265.34	
මොණරාගල	15,421.55	
නුවර එළිය	896,857.63	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - බද්දේගම	56,285.15	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මීරිජ්ජවිල	238,514.43	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නාරාහේන්පිට	442,932.12	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නියාගම	522,744.78	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ඔරුගොඩවත්ත	99,992.52	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රත්මලාන	337,159.54	
ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - තලල්ල	17,527.92	
පොළොන්නරුව	1,392,484.79	
පුත්තලම	231,005.00	
රත්නපුරය	196,299.87	
ත්‍රිකුණාමලය	375,220.88	
වවුනියාව	752,292.44	
අතැති මුදල්	1,898.10	

විස්තරය	හර	බැර
අතැති චෙක්පත්	280,200.00	
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		17,554,429.60
රජයේ පුනරාවර්තන ප්‍රදාන - භාණ්ඩාගාරය		1,480,473,000.00
විලම්භිත ආදායම් ප්‍රදාන - පුනරාවර්තන		141,350,858.16
වෙන් කිරීම් සහ අතිරික්තයන්		
විලම්භිත ආදායම් ප්‍රතිපාදන		4,007,794,657.66
පාරිතෝෂිකයන් සඳහා ප්‍රතිපාදන		437,388,627.00
නැවත තක්සේරු කළ අධිභාරය		2,483,219,190.99
ගෙවීම්		
විගණන ගාස්තු ගෙවීම්		1,113,163.00
පාඨමාලා ගාස්තු ගෙවීම්		481,550.00
තැන්පතු		111,000.00
සේ.අ.අ. ගෙවීම්		14,459,097.45
සේ.නි.භා.අ. ගෙවීම්		2,169,151.72
දේශක ගාස්තු ගෙවීම්		7,402,208.50
වෙනත් ගෙවීම්		15,770,213.38
ව්‍යාපෘති අරමුදල් ගෙවීම්		2,234,109.00
යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - වසර 13		148,289,641.92
අත්තිකාරම් ලැබීම්		1,164,775.00
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		1,916,165.01
රඳවා ගත් මුදල්		27,493,622.18
වැටුප් ගෙවීම්		1,442,782.77
කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම්		221,000.00
ශිෂ්‍ය රක්ෂණ ගෙවීම්	1,012,750.00	38,885,000.00
වෙළඳ ණයගැතියන්		4,638,675.87
W & O P ගෙවීම්		45,342.00
උපචිත වියදම්		
උපචිත වෘත්තීය මාර්ගෝපදේශනය		200,773.16
උපචිත විදුලි බලය		3,571,955.92
උපචිත විභාග සහ ඇගයීම්		1,799,127.00
උපචිත ඉන්ධන සහ ලිහිසි තෙල්		9,113.75
උපචිත සනීපාරක්ෂක සේවා		1,066,875.00
උපචිත නඩත්තු කිරීම්		2,465,045.53
උපචිත පුවත්පත් සහ වාර සංග්‍රහ		41,250.00
උපචිත සේවාස්ථ පුහුණුව		692,750.00
උපචිත අතිකාල සහ නිවාඩු දින වියදම්		2,210,023.06
උපචිත අර්ධකාලීන වියදම්		16,052,285.17
උපචිත ප්‍රවර්ධන වියදම්		1,279,378.00
උපචිත කුලී, වරිපනම් සහ බදු		790,334.36
උපචිත වාර ප්‍රවේශ පත්‍ර		1,514,767.49
උපචිත ආරක්ෂක සේවා		3,663,057.30

විස්තරය	හර	බැර
උපචිත වැටුප් දීමනා		3,792,200.00
උපචිත දුරකථන ගාස්තු		2,890,618.16
උපචිත ප්‍රවාහනය		178,050.00
උපචිත ගමනාගමනය		826,968.45
උපචිත ජලය		839,314.13
වෙනත් ආදායම්		
වෙන්දේසි ආදායම්		1,762,155.70
පාඨමාලා ගාස්තු		1,095,000.00
ආපන ශාලා ආදායම්		356,500.00
සමාගම් ලියාපදිංචිය		23,000.00
දෛනික කටයුතු		800.00
ව්‍යවසායකත්ව වැඩසටහන		122,000.00
දඩ		2,878,734.96
ශාලා ආදායම්		1,423,025.00
නේවාසිකාගාර ගාස්තු		11,000.00
කතරගම සංචාරක බංගලාව		496,060.00
ණය වාරික		1,954,406.26
විවිධ ආදායම්		5,082,779.85
ආපසු නොගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		532,500.00
ලියාපදිංචි ගාස්තු		11,700.00
නිම කළ භාණ්ඩ විකිණීම්		398,500.48
ඉතුරුම් ගිණුම් පොළිය		1,239,809.53
සැපයුම් ලියාපදිංචිය		89,100.00
ඉංග්‍රීසි පොත් ආදායම		87,500.00
නිෂ්පාදන ඒකකයේ ආදායම		
10% ඉපැයුම්		1,783,483.91
අර්ධ කාලීණ පාඨමාලා		29,880,481.26
මුද්‍රණ පාසල - නාරාහේන්පිට		390,449.20
පෙර ඉගැනුම් හඳුනා ගැනීම (RPL)		11,117,238.11
වාහන සේවා කිරීම		6,975.00
වෙනත් නිෂ්පාදන ඒකක		1,009,119.98
විශේෂ ව්‍යාපෘතිවලින් ආධාර		
ලෝක නිපුණතා දිනයේ ආධාර		281,300.00
SSDP මගින් ආධාර		189,957,728.77
GIZ මගින් ආධාර		108,155.00
ILO මගින් ආධාර		129,900.00
මහවැලි අධිකාරිය මගින් ආධාර		4,000,000.00
WUSC ව්‍යාපෘතිය මගින් ආධාර		122,000.00
අමාත්‍යාංශ වෘත්තීය මාර්ගෝපදේශනය මගින් ආධාර		119,450.00
සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීමේ අරමුදල		609,486.00

විස්තරය	හර	බැර
අමාත්‍යාංශය මගින් ආධාර - 13 වසර		312,748.25
ලෝක ආහාර සංවිධානය මගින් ආධාර		8,250.00
කාර්ය මණ්ඩල වියදම්		
සේ.අ.අ. වියදම්	130,797,365.11	
සේ.නි.භා.අ. වියදම්	32,685,031.45	
සේ.නි.භා.අ. අධිභාරය	5,641,480.00	
වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම්)	251,094,018.05	
වැටුප් සහ අතිකාල	664,748,664.39	
සේවක පාරිතෝෂිකය	81,550,013.98	
ගමනාගමනය		
නවාතැන් වියදම්	671,249.00	
ගමනා ගමනය - දේශීය	7,664,002.68	
ගමනා ගමනය - විදේශීය	6,158,098.39	
වියදම් වර්ගීකරණය	2,444,285.00	
සැපයුම් සහ වෙනත් පරිභෝජනයන්		
ඉන්ධන සහ ලිහිසි තෙල් ගාස්තු	18,831,710.93	
වෙනත් සැපයුම්	2,039,971.94	
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	10,951,483.17	
මුද්‍රිත ද්‍රව්‍ය	988,306.20	
නඩත්තුව		
ගොඩනැගිලි නඩත්තුව	10,505,478.82	
දේපල සහ පිරියත නඩත්තුව	8,901,942.42	
වාහන නඩත්තුව	12,121,036.82	
කාර්යාල උපකරණ නඩත්තුව	896,340.32	
ගිවිසුම්ගත සේවා		
වෙළඳ දැන්වීම්	3,324,218.75	
විගණන ගාස්තු	1,200,000.00	
විදුලි බිල් ගාස්තු	53,303,348.88	
කුලී ගාස්තු	4,251,920.00	
රක්ෂණ	2,974,536.56	
සනීපාරක්ෂක සේවා	13,070,560.74	
පුවත්පත් සහ වාර සංග්‍රහ	533,867.50	
තැපැල් ගාස්තු	1,378,554.83	
කුලී, වරිපනම් සහ බදු	8,808,218.26	
ආරක්ෂක ගැස්තු	42,241,631.59	
සේවක සුභසාධනය සහ වෙනත්	4,385,837.00	
දුරකථන ගාස්තු	23,142,540.54	
ප්‍රවාහනය	2,252,901.39	
ජල බිල්පත්	10,734,378.17	

විස්තරය	හර	බැර
රැකියාගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය		
විෂයමාලා සංවර්ධනය	483,700.00	
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය	9,199,500.00	
ව්‍යවසායකත්ව වැඩසටහන්	517,488.16	
රැකියාගත කිරීම	681,435.40	
පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන	75,541.00	
රාජ්‍ය පුද්ගලික සහභාගිත්වය	560,247.00	
වෙනත් මෙහෙයුම් වියදම්		
විභාග සහ ඇගයීම්	3,405,293.00	
ප්‍රසාද දීමනා	453,550.00	
නීති ගාස්තු	240,276.00	
විවිධ වියදම්	6,159,823.87	
තත්ත්ව කළමනාකරණය සහ ප්‍රතීතනය	1,408,085.10	
වාර ප්‍රවේශ පත්‍ර	6,195,875.78	
විශේෂ පුහුණු වැඩසටහන්	435,873.00	
වැටුප් දීමනා	19,352,250.00	
ආවුද සහ පරිභෝජනයන්	1,616,458.62	
පුහුණු අධීක්ෂණය	133,829.00	
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම		
ලෝක නිපුණතා දින වැඩසටහන සඳහා වියදම	281,300.00	
SSDP සඳහා වියදම	189,957,728.77	
GIZ සඳහා වියදම	108,155.00	
ILO සඳහා වියදම	129,900.00	
මහවැළි අධිකාරිය සඳහා වියදම	4,000,000.00	
WUSC ව්‍යාපෘතිය සඳහා වියදම	122,000.00	
අමාත්‍යාංශ වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා වියදම	119,450.00	
සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීමේ අරමුදල	609,486.00	
අමාත්‍යාංශය සඳහා වියදම - වසර 13	312,748.25	
ලෝක ආහාර සංවිධානය සඳහා වියදම	8,250.00	
මූල්‍ය වියදම		
බැංකු අය කිරීම්	121,787.51	
පුහුණු ද්‍රව්‍ය	107,665,068.33	
කාර්ය මණ්ඩල පුහුණු කිරීම - ධාරිතා සංවර්ධනය	4,691,010.50	
ප්‍රවර්ධන වියදම්	12,799,113.18	
වෘත්තීය මාර්ගෝපදේශනය	1,582,347.66	
ක්ෂය වීම්	141,350,858.16	
ලාභ / අලාභහානි ගිණුම්	1,148,719,580.99	347,982,695.50
පෙර වසරේ ගැළපීම		788,545.86
අනුමත හැරයාම් - 2017	704,950.00	
අනුමත හැර යාම් - 2016	79,900.00	
නැවත තක්සේරු කළ අලාභ	73,100,211.56	
එකතුව	**10,703,537,758.63**	**10,703,537,758.63**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VTY/E/VTA/01/18/19

මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2020 ඔක්තෝම්බර් 19 දින

සභාපති
ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වියවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 අභිතකර මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4663 ක් ලෙස අගය දක්වා තිබුණු ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. මෙම නිසා මෙකී ඉඩම් හා ගොඩනැගිලි වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් පෙන්නුම් නොකෙරුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විට අදාල වත්කම් පන්තියට අයිතිව තිබූ වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.4,496,902 ක් වූ මෝටර් රථ 39 ක් හා පාපැදි 25 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 60 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය නිවැරදිව නියෝජනය වන ආකාරයට අදාළ ක්ෂය කිරීමේ පදනම හඳුනාගත යුතු අතර ඡේද අංක 74 අනුව භාවිතා කරන ක්ෂය ක්‍රමය වත්කමේ උපයෝජන රටාව නියෝජනය කලයුතුය. එහෙත් අධිකාරිය විසින් දෙසැම්බර් 31 දිනට වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීමේදී ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට ගෙන තිබුණද එම වත්කම් වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන අදාල ක්ෂය ප්‍රතිපත්තිය සංශෝධනය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 22 ඡේදය ප්‍රකාරව සේවක භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු රු.7,898,073 ක හිඟ අධිභාර මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදය පරිදි පශ්චාත් සේවක ප්‍රතිලාභ මැනීමේදී ආයුගණක ශිල්ප ක්‍රම භාවිතා කරමින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදුකල යුතු වුවත්, ඊට පටහැනි ලෙස අධිකාරිය විසින් සේවකයින් අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන සේවක ප්‍රතිලාභ මැනීම සිදුකර තිබුණු අතර ප්‍රමිතයේ 65 ඡේදය අනුව සේවක ප්‍රතිලාභ වගකීම් ශේෂය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. එසේම පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු. 2,135,660 ක් වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් අක්කර 06 රූඩ් 01 පර්චස් 13.2 ක් වූ ඉඩමකින් අක්කර 02 රූඩ් 03 පර්චස් 7.6 ක් 2015 වර්ෂයේ දී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට පවරා දී තිබුණද එහි පොත් අගය වූ රු.202,278,158 ක් ,2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් වටිනාකමින් ඉවත් කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට ලැබී තිබූණු අක්කර 02 රූඩ් 03 පර්චස් 38.38 ක්වූ ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද අධිකාරියේ මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන රජයේ ඉඩම් 91 ක වටිනාකම තක්සේරු කර 2018 දෙසැම්බර් 31 දින දක්වාම ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වර්ග 4 කට අදාළව වර්ෂයේ ක්ෂය වියදම ගණනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය හා විලම්භීත ආදායම රු.211,926,365 ක් අඩුවෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. එසේම වත්කම් වර්ග දෙකකට අදාලව ප්‍රත්‍යාගණන අතිරික්තය රු.157,565,717 ක් අඩුවෙන් හා වත්කම් වර්ග දෙකකට අදාලව ප්‍රත්‍යාගණන අලාභය රු.54,420,648 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.54,420,648 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2018 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වලට අදාල සමුච්චිත ක්ෂය වෙන්කිරීම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු.43,119,356 ක් වැඩියෙන් හා සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වියදම රු. 2,733,488 ක් අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් යටතේ ගොඩනැගිලි ධාරණ අගය රු. 40,385,868 ක් හා වර්ෂයේ ඌනතාවය රු. 2,733,488 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2019 (2)

(එ) 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ගෙවීමට සිදු වී තිබුණු රු.33,776,537 ක හිඟ දායක මුදල හා රු.5,641,480 ක අධිභාර මුදල් සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ ඌණතාවයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය හා දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීමේ පදනම මත ලබා ගෙන තිබූ එකතු වටිනාකම රු. 211,713,535ක් වූ වත්කම් ගිණුම්වලින් අත්හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා වර්ෂයට අදාල ක්ෂය වියදම රු.5,878,664ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම විලම්භීත ආදායම් ගිණුමේ ශේෂය ද

රු. 5,878,664 ක් අඩුවෙන් හා විලම්භිත ආදායම් ප්‍රදාන ගිණුමේ ශේෂය රු. 187,622,028 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම

මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මතය සඳහා පදනම කොටසේ ඇතුළත් (ඊ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට අධිකාරියට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 1646	අධිකාරියේ ප්‍රධාන කාර්යාලය භාවිතා කරනු ලබන වාහන 19 ක හා දිස්ත්‍රික් කාර්යාලවල භාවිතා කරනු ලබන වාහන 22 ක 2018 වර්ෂයට අදාල ධාවන සටහන් 2019 සැප්තැම්බර් මාසය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර එම වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන සඳහා රු.1,742,025 ක් වැයකර තිබුණි .
(ආ) 2019 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛයට පටහැනි ලෙස අධිකාරියේ සේවකයින් 19 දෙනෙකු විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම් පිටවීම් වේලාවන් සටහන් කර නොතිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය	සෑම වාහනයකම මාස 12 කට වරක් හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනයෙන් පසුව ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවත් ඍත්තීය පුහුණු අධිකාරියේ වාහන සම්බන්ධයෙන් 2016 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් මාසය දක්වාම ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.
(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය	යොමුගත රෙගුලාසියට පටහැනි ලෙස අධිකාරියේ වාහන දෙක බැගින් අමාත්‍යාවරයාගේ සහ රේඛීය අමාත්‍යාංශයේ රාජකාරී සඳහා මුදාහැර සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන වෙනුවෙන් අධිකාරිය රු. 712,870 ක් වැය කර තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් ඇස්තමේන්තුව ඉක්මවා රු. 4,133,000 ක පුහුණු උපකරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මෝටර් කාර්මික ශිල්පීය පාඨමාලාව සඳහා මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 වගන්තියට පටහැනි ලෙස නැවත ඇණවුම් කිරීම සිදුකර තිබුණු අතර 2017 මාර්තු 15 දිනැති ප්‍රසම්පාදන අතිරේක 33 හි සඳහන් මූල්‍ය සීමාව ඉක්මවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර තිබුණි.

(ආ) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීමේ කටයුතු කළ වැඩවල වටිනාකම රු. 19,353,158 ක් පැවතියදී ගිවිසුම් කඩ කිරීම මත 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් කාර්යය අත්හිටුවා තිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් අධිකාරියට අයවිය යුතු එකතුව රු. 3,819,000 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2019 ජූලි 18 දින දක්වාම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ආංශික නිපුණතා සංවර්ධන අරමුදල්, භාණ්ඩාගාර අරමුදල් හා ලෝක කම්කරු සංවිධාන (ILO) අරමුදල් යටතේ 2016 වර්ෂයේ සිට 2019 ජූලි මාසය දක්වා මිලදීගෙන තිබුණු රු.8,362,833 ක් වටිනා පුහුණු උපකරණ අයිතම 1117 ක් අදාල පුහුණු මධ්‍යස්ථාන වෙත බෙදාහැරීමකින් තොරව අධිකාරියේ ප්‍රධාන ගබඩාවේ රඳවාගෙන තිබුණු අතර මෙම උපකරණ සඳහා ලබාදී තිබූ වගකීම් කාලයන් ගබඩාව තුලදීම කල් ඉකුත් වී තිබුණි. ඉන් වටිනාකම රු. 426,452 ක්වූ පුහුණු උපකරණ අයිතම 83 ක් අස්ථාන ගත වී තිබුණු බව 2019 අගෝස්තු 09 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් රු.මිලියන 7,430 ක් වැය කරමින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා පවත්වනු ලබන පුහුණු මධ්‍යස්ථාන 90 ක් 2016 වර්ෂය අවසාන වන විට නවීකරණය කිරීමට හා 2017 වර්ෂය අවසාන වන විට නව පුහුණු මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම සඳහා සැලසුම්කර තිබුණි. එහෙත් 2018 දෙසැම්බර් 31 දින වන

විට පුහුණු මධ්‍යස්ථාන 25 ක් නවීකරණය කර තිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක පමණක් ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි.

(ආ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කර තිබුණු අහංගම හෝටල් පාසලේ නවීකරණ කටයුතු වල මූලික සැලසුම් වෙනස් කිරීම හා ඉදිකිරීම් ප්‍රමාදවීම් හේතුවෙන් පාඨමාලාවන් 04 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවැත්වීමට නොහැකිවී තිබූ අතර නවීකරණ කටයුතු රු.121,809,064 ක් වැය කර 2018 මාර්තු 08 දින අවසන් කර ඇතත් 2019 සැප්තැම්බර් 30 දින දක්වාම සංචාරක හෝටලයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද පාඨමාලා සඳහා ප්‍රායෝගික පුහුණුවට අවශ්‍ය යැයි සඳහන් කරමින් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.28,158,840 ක පුහුණු උපකරණ හා රු.9,397,178 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ජාත්තීය පුහුණු ක්ෂේත්‍ර 13 කට අදාලව පැවැත්වීමට සැලසුම් කර තිබූ පූර්ණ කාලීන පාඨමාලා 09 ක හා අර්ධ කාලීන පාඨමාලා 39 ක පුහුණු වැඩසටහන් 64 ක් 2018 වර්ෂය තුලදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඈ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේනකඩුව පිහිටි වෙලේවත්ත නැමැති ඉඩමෙන් රූඩ් 02 පර්චස් 33.50 ඉඩම් ප්‍රමාණයක් රු. 5,823,000 ක් ගෙවා 2010 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණද 2020 පෙබරවාරි 24 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) අධිකාරිය විසින් ගාල්ල දිස්ත්‍රික් මුද්‍රණ පාසැල පවත්වාගෙන යනු ලබන ඉඩමේ පැරණි ගොඩනැගිල්ල ඉවත්කර රු. 36,347,620 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් යටතේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2016 ඔක්තෝබර් මාසයේදී ආරම්භකර 2017 සැප්තැම්බර් 23 දින නිමකල යුතු විය. ඉදිකිරීම් කටයුතු නියමිත දිනට ඉටු නොකිරීම හේතුවෙන් 2018 අගෝස්තු 28 දින ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. එසේම එම ඉඩමේ අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2019 දෙසැම්බර් මාසය දක්වාම කටයුතු කර නොතිබුණි. තවද 2007 වසරේදී රු. මිලියන 15ක් පමණ වැයකර පුහුණු කටයුතු සඳහා මිලදීගෙන තිබුණු මුද්‍රණ යන්ත්‍රය 2018 අප්‍රේල් 03 දින සිට කොටසක් ඉදිකර තිබුණු නව ගොඩනැගිල්ලේ නිශ්කාර්යව තැන්පත් කර තිබුණි. ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් 2017 ඔක්තෝබර් මාසයේ සිට බදු පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක මුද්‍රණ පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර එම මාසයේ සිට 2019 ජූලි මාසය දක්වා බදු කුලිය ලෙස රු. 803,000ක් ගෙවා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ජ'නල් සටහන් අනුමත කිරීමේ සීමාවන් හඳුනාගෙන බලතල බෙදාහැර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 774 සිට රු. 74,407,442 ක පරාසයක පැවති ජ'නල් සටහන් 416 ක් ආයතනයේ මූල්‍ය අංශයේ නිළධාරීන් විසින් අනුමත කළ හැකි සීමාවන් නොසලකා අනුමත කර තිබීම අධිකාරියේ අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය කෙරේ.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ වාර්තාව

1.2.

(අ). අධිකාරියේ සියළු ඉඩම් ගොඩනැඟිලි ප්‍රත්‍යාගණන කටයුතු සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුවට භාර දී ඇති අතර එම කටයුතු තවම අවසන් වී නොමැති අතර අවසන් වූ වහාම අවසන් ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ඇත.

(ආ). දැනට මේ පිළිබඳව නිර්දේශ ලබා දීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර අදාළ නිර්දේශ ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරමි.

(ඇ). අධිකාරිය දැනට වත්කමේ ආයුකාලය හා අධිකාරියේ න්‍යාය ප්‍රතිපත්තිය වන හීන වන ශේෂ ක්‍රමය පදනම් කරගෙන ක්ෂය කිරීම් සිදු කර ඇත. ඉදිරියේදී ප්‍රත්‍යාගණනය සිදු කරන අවස්ථාවේදී ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

(ඈ). සේවක අර්ථසාධක අරමුදලින් නඩු පැවරීම සිදු කර ඇති බැවින් භාණ්ඩාගාරයෙන් මේ සඳහා වෙනමම මුදල් ප්‍රතිපාදන ලබා නොදුන් නිසා වාර්ෂිකව ලබා දෙන ප්‍රතිලාභ මත ගෙවීම් සිදු කරන ලදී.

(ඉ). මෙම ක්‍රමය අනුගමනය කිරීමට පියවර ගත් විට විශාල පිරිවැයක් දැරීමට සිදු වන අතර මේ පිළිබඳව තවදුරටත් කරුණු සොයා බලා ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගනිමි.

(ඊ). දැනට ඉඩම් ගොඩනැඟිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුවට භාර දී ඇති අතර එය අවසන් වූ වහාම මෙම අගය පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ). 2019 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඌ). 2019 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි මෙය නිවැරදි කර ඇත.

(එ). භාණ්ඩාගාරයෙන් මේ සඳහා වාරික වශයෙන් මුදල් ලැබුණු බැවින් මුදල් ලැබුණු වර්ෂ අනුව ගෙවීම් කර වියදමක් ලෙස ගළපා ඇත.

(ඒ). මෙම ශේෂයන් 2019 වර්ෂයේ අවසන් ගිණුම් නැවත ඉදිරිපත් කිරීමේදී නිවැරදි කර ඇත.

2.

(අ). 2019 වසරේ සිට සියළු වාහන සටහන් නිසි පරිදි ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. දැනට මාසික ධාවන සටහන් නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කරමි.

(ආ). අධිකාරියේ සියළුම නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් අනුව සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් හා විධිමත් පරිදි ප්‍රධාන කාර්යාලයේ ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීමට කටයුතු කර ඇත.

(ඇ). දැනටමත් ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇති අතර එහි වාර්තාව ප්‍රවාහන ඒකකය වෙත භාර දී ඇත.

(ඈ). අවශ්‍යතාවය මත රේඛීය අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු සඳහා වාහන ලබා දුන් අතර මේ වන විට එම වාහන නැවත ලබා ගැනීමට කටයුතු කර ඇත.

(අ). 2018 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ පුහුණු උපකරණ මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටු වලින් ප්‍රතික්ෂේප වීම, මිල ගණන් ඉදිරිපත් කර නොතිබීම, අවසන් තාක්ෂණික ඇගයීමේදී ප්‍රතික්ෂේප වීම, රියදුරු පාසැල සඳහා සැලසුම් කළ පරිදි මෝටර් රථ මිල දී ගැනීමට නොහැකි වීම වැනි කරුණු මත අදාළ වර්ෂයේ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 10ක මුදලක් ඉතිරි වූ බැවින් එම ඉතිරි ප්‍රතිපාදන යොදවා

මෝටර් කාර්මික ශිල්පී පාඨමාලාව සඳහා අත්‍යාවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගන්නා මෙන් අධ්‍යක්ෂ (පුහුණු) විසින් සිදු කරනු ලැබූ ඉල්ලීම පරිදි රු.4,133,000ක උපකරණ 2018 ප්‍රසම්පාදන සැලසුමේ නොමැති වුවද මිලදී ගැනීමට සිදු විය. අදාළ වර්ෂය තුළ දී මිල දී ගැනීමේ ක්‍රියාවලිය අවසන් කළ යුතුව තිබූ බැවින් හා ඒ පුහුණු කටයුතු සඳහා පාඨමාලා ආරම්භ කිරීමට ප්‍රථම මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් තිබූ බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 3.5/3.6 පරිදි 50% පදනම මත මිල දී ගනු ලැබීය. මේ සඳහා දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන ඇති අතර මාර්ගෝපදේශන සංග්‍රහයට 2017.03.15 දින සිට බලාත්මක කර ඇති අතිරේක 33 අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමත කිරීමේ සීමාව රුපියල් මිලියන 100 දක්වා පවතින බවද කාරුණිකව දැනුම් දෙමි. මුල් මිලදී ගැනීමේ සිට 50% ගැනීම දක්වා කාලය තුළ රුපියලේ අවප්‍රමාණය සසඳා බලන විට ආයතනයට මූල්‍යමය හානියක් සිදුව නොමැති බවද සඳහන් කරන අතර කෙසේ වෙතත් 50% සීමාව යටතේ භාණ්ඩ මිලදී ගැනීම මේ වන විට නවතා ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

(ආ). 2017 2018 2019 යන වසර වල මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමට හා අඩුපාඩු සකසා ගොඩනැඟිල්ල භාවිතයට ගත හැකි වන පරිදි සැකසීමට කටයුතු කළද බලාපොරොත්තු වූ ප්‍රතිපාදන නොලැබීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කළ නොහැකි විය. නැවත 2020 වසරේද ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදන මත මෙම ව්‍යපෘතිය ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී.

රු. 3,819,000.00 ක මුදල අධිකාරියට අවාසි නොවන පරිදි පියවා ගත හැකි ක්‍රමය වන්නේ මෙම ව්‍යාපෘතියේ රැඳවුම් මුදල ලෙස රඳවාගෙන ඇති මුදලෙන් හැකි තරම් කොටසක් පියවා ගැනීමටත්, කොන්ත්‍රාත් ආයතනය සතුව ඇති දේපළ නැවතත් තක්සේරු කර සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර එමඟින් ඉතිරි හිඟ මුදල පියවා ගැනීමටත්ය.

(ඇ). මෙහිදී පැහැදිලිව ගබඩාවේ භෞතිකව පරීක්ෂාවේදී ඌණතාවයක් නොමැති අතර ගබඩාවේ සියළු උපකරණ නියමිත පරිදි මධ්‍යස්ථාන වලට බෙදාහැරීම් සිදු කර ඇත.

3.

(අ). මේ වන විට මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘති 27 ක් අවසාන කර ඇත.

නව මධ්‍යස්ථාන 4 ක වැඩ නිම කර භාවිතයට ගෙන ඇත.

තවත් නව මධ්‍යස්ථාන 2 ක වැඩ මේ වසර අවසාන වන විට නිම වීමට නියමිතව ඇත.

පානදුර නව මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා දෙවරක් මිළ ගණන් කැඳවන ලදුව එහි ප්‍රසම්පාදන කටයුතු අවසාන කර ඇත.

(ආ). මේ වන විට මෙම පුහුණු හෝටලය ක්‍රියාත්මක තත්වයේ පවතින අතර, දැනට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ විවිධ වැඩසටහන්, රැස්වීම්, නේවාසික වැඩසටහන් යනාදිය සඳහා තෝරාගනු ලබන්නේද මෙම හෝටල් පරිශ්‍රයයි.

(ඇ). පූර්ණකාලීන පාඨමාලා

සැලසුම් කරන ලද නමුදු පහත සඳහන් හේතූන් මත ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙහි අර්ධකාලීන පාඨමාලාවන් ආරම්භ කිරීමට නොහැකිව ඇති අතර එම තත්ත්වයන් නිවැරදි කර ගැනීම පිණිස අර්ධ කාලීන පාඨමාලාවන් කීපයක් පුහුණු අංශය මැදිහත් වීමෙන් විවිධ ආයතනවල ඉල්ලීම මත අවබෝධතා ගිවිසුම්වලට එළඹ ආරම්භ කර ඇත.

- අර්ධකාලීන පාඨමාලා සඳහා වන ඇස්තමේන්තුවෙහි අවම ආධුනික සංඛ්‍යාව සම්පූර්ණ නොවීම.
- සුදුසුකම්ලත් උපදේශකවරුන් බඳවා ගැනීමේදී ඇති වන දුෂ්කර තාවයන්.
- අර්ධකාලීන පාඨමාලාවන් පවත්වාගෙන යාම උපදේශකවරුන් හට අනිවාර්ය කිරීමේ ඇති අපහසු තාවයන්.
- අර්ධ කාලීන පාඨමාලාවන්හි උපදේශකවරුන් සඳහා පුහුණු පැයකට ගෙවන දීමනාව ප්‍රමාණවත් නොවීම.
- NVQ 04 සුදුසුකම ලබා ඇති උපදේශකවරුන් හට NVQ 05 සුදුසුකම ලබා ගැනීම ආයතනික අවශ්‍යතාවයක් බැවින් සතිඅන්ත දිනවලදී අදාල උපදේශකවරුන් පුහුණුව සඳහා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය සහ වෙනත් ආයතන වෙත යොමු කිරීම නිසා උපදේශකවරුන් හට අර්ධකාලීන පාඨමාලා පැවැත්වීමට අවකාශ නොමැති වීම.

- පූර්ණකාලීනව ඉගැන්වීම් කටයුතු වල යෙදෙන උපදේශක උපදේශිකාවන් සිය පෞද්ගලික හේතූන් තම අර්ධකාලීන පාඨමාලාවන්හි පුහුණුව සඳහා සහභාගී වීමට ඇති අකමැතිභාවය.

(ඇ). මෙම ඉඩම මිල දී ගෙන ඇත්තේ මධ්‍යස්ථානයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහාය. මෙම ඉඩම මිලදී නොගත්තේ නම් වෘත්තීය පුහුණු ආයතනයට ප්‍රවේශ වීමට මාර්ගයක් ද නොමැත. තවද මෙම ඉඩම වෙනත් පාර්ශවයක් විසින් මිල දී ගෙන යම් ඉදි කිරීමක් සිදු කළේ නම් එය ආයතනයේ ආකර්ශණය පෙනුමටද හානිකර වන්නට ඉඩ තිබුණි. එම නිසා මෙම ඉඩම මිලදී ගැනීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට උපාය මාර්ගික වශයෙන් ඉතා වැදගත් වේ. මේ වන විට හේනකඩුව මධ්‍යස්ථානයේ ආධුනිකයින්ගේ බාහිර ක්‍රියාකාරකම් සහ දෛනික ක්‍රියාකාරකම් සඳහා ද මෙම ඉඩම ඵලදායී ලෙස යොදා ගන්නා බැවින් මෙම ඉඩම නිෂ්කාර්‍යව පවතීයැයි කිව නොහැක.

(ඉ). මෙ වන විට පවරා ගැනීම් කටයුතු වල අවසන් අදියරේ පවතී. එනම් සියළු ලිපි ගොනු ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර එම අමාත්‍යාංශය විසින් ඉදිරියේදී නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත එය පැවරීමේ කටයුතු සිදු කරනු ඇත. ඉන් පසුව නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම දේපළ අප අධිකාරියේ භාවිතය සඳහා විධිමත්ව පැවරීම සිදු කරනු ඇත.

දැනට මෙම භූමියේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා අප අධිකාරියට අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව පෙට්ටිගලවත්ත නවීකරණ හා සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එම කටයුත්ත සිදු කරන ලද කොන්ත්‍රාත් ආයතනය මෙම නවීකරණ ව්‍යාපෘතියේ වැඩ නිම කර අප වෙත භාර දී ඇති අතර, මේ වන විට මෙම ගොඩනැගිල්ලේ මුදුණ යන්ත්‍රය ස්ථාපනය කර පාඨමාලා ක්‍රියාත්මක කරමින් පවතී.

(ඊ). 2020 වර්ෂයේ සිට පීනල් සටහන් අධ්‍යක්ෂ (මුදල්) ලවා අත්සන් කිරීමට කටයුතු කර ඇත.